ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

இலங்கை தேசிய திரைப்படக் கூட்டுத்தாபனம்

NATIONAL FILM CORPORATION OF SRI LANKA

# 2016 වාර්ෂික වාර්තාව

# ஆண்டறிக்கை

# ANNUAL REPORT

# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

# වාර්ෂික වාර්තාව

## 2016

# පටුන


| | පිටුව |
|---|---|
| පිළිගැන්වීම | 01 |
| පාලන වාර්තාව | 02 - 25 |
| ශේෂ පත්‍රවල ලාභාලාභ ගිණුම් ආශ්‍රිත සටහන | 26 - 64 |
| විගණකාධිපති වාර්තාව | 65 - 81 |

# පිළිගැන්වීම

දිනය : 2017.11.06 මගේ අංකය : එන්එෆ්සි/103/05/02/98

ගරු රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍ය
රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

ගරු ඇමතිතුමනි,

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව - වාර්ෂික වාර්තාව 2016**

1980 අංක 45 දරණ පනතින් සංශෝධිත 1971 අංක 47 දරණ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32 (1) වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාර 2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා පහත සඳහන් ලේඛනයන් ද සමඟ සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

1. 2016 වසරේ සංස්ථාව විසින් කරන ලද කාර්යයන් හා අදාල ප්‍රකාශ
2. 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සංස්ථාවේ ලාභාලාභ ගිණුම්, ආශ්‍රිත සටහන් හා එදිනට ශේෂ පත්‍රය
3. 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා විගණකාධිපති වාර්තාව

මෙයට - විශ්වාසී වූ ,

සිතේන්ද්‍ර සේනාරත්න
සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

# පාලන වාර්තාව


01. හැඳින්වීම

02. අධ්‍යක්ෂ මණ්ඩලය

03. දේශීය චිත්‍රපට නිෂ්පාදනය

04. පිරිස් හා ආයතන පාලනය

05. චිත්‍රපට ප්‍රචාරනය/සිනේ ඇඩ්ස්

06. චිත්‍රපට ප්‍රදර්ශනය

07. අභ්‍යන්තර විගණන කටයුතු

08. සිනමා සංස්කෘතිය හා අධ්‍යාපන කටයුතු

09. දේශීය සැපයුම් - ආනයනය හා අපනයනය

10. චිත්‍රපට ගබඩාව

11. නෛතික කටයුතු

12. මූල්‍ය කටයුතු

13. චිත්‍රාගාරය

14. පරික්ෂණ කටයුතු

15. සුභසාධනය

16. ක්‍රීඩා සංගමය

17. ආගමික කටයුතු

18. වෛද්‍ය සහනාධාර ක්‍රමය

19. වෘත්තීය සමිති

20. ස්තුතිය

## 01. හැඳින්වීම

1980 අංක 45 දරණ පනතින් සංශෝධනය කල 1971 අංක 47 දරණ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32 (1) වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (1) වගන්තිය යටතේ ගරු රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍ය රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා හා විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2016 වර්ෂය පිළිබඳ වාර්තාව

2016 වර්ෂය පිළිබඳ ඉදිරිපත් කරන මෙම වාර්තාව ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 45 වන ක්‍රියාත්මක වර්ෂයට අදාල වේ.

## 02. අධ්‍යක්ෂ මණ්ඩලය

2016 වර්ෂය තුල ජාතික චිත්‍රපට සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය පහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විතව ඇත.

| | | |
|---|---|---|
| 1. | නීතිඥ දීපාල් චන්ද්‍රරත්න මහතා | - සභාපති |
| 2. | සම්පත් සුභසිංහ ආරච්චි මහතා | - ක්‍රියාකාරි අධ්‍යක්ෂ |
| 3. | ආචාර්ය එස්.කේ.එම්.ඩී.දර්ශනී ගුණතිලක | - අ.ම.සාමාජික (නිලබලයෙන්) |
| 4. | විශේෂඥ වෛද්‍ය අනිල් සමරනායක | - අ.ම.සාමාජික |
| 5. | පී.වී.පී.දයාරත්න මිය | - අ.ම.සාමාජික |
| 6. | නයන හෙට්ටිආරච්චි මහතා | - අ.ම.සාමාජික |
| 7. | අමල් අල්විස් මහතා | - අ.ම.සාමාජික |
| 8. | එන්.ගොඩකන්ද මිය | - භාණ්ඩාගාර නියෝජිත |
| 9. | නීතිඥ ඩබ්.කේ.වික්‍රමආරච්චි මිය | - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් |

## 03. දේශිය චිත්‍රපට නිෂ්පාදනය

### 3.1. දේශිය චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කිරීම.

2016 වර්ෂය තුළ ලියාපදිංචි චිත්‍රපට සංඛ්‍යාව 54 කි.

එක් චිත්‍රපටයක් ලියාපදිංචි කිරීම සඳහා රු.2,000/- ක මුදලක් සංස්ථාව නිෂ්පාදකගෙන් අයකරනු ඇත.

## 3.2 දේශිය චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලබාදෙනු ලබන ණය පහසුකම්

### 3.2.1 චිත්‍රාගාර සේවා ණය පහසුකම්

අනුමත චිත්‍රාගාර සේවා ණය පහසුකමේ වටිනාකම රු.400,000/- කි. මෙම වසර තුල චිත්‍රාගාර සේවා ණය පහසුකම් කිසිදු චිත්‍රපට නිෂ්පාදකවරයෙකු හෝ ඉල්ලුම් කර නැත.

### 3.2.2 චිත්‍රපට නිෂ්පාදන සඳහා ණය පහසුකම් ලබාදීම

මෙම වර්ෂය තුල චිත්‍රපට නිෂ්පාදනය සඳහා නිෂ්පාදන ණය පහසුකමක් ඉල්ලුම් කර නොමැත.

### 3.2.3 විශේෂ ණය පහසුකම්

මෙම වර්ෂය තුල කිසිදු විශේෂ ණය පහසුකමක් ලබා දී නොමැත.

### 3.2.4 පිටපත් මුද්‍රණය සඳහා ණය පහසුකම් ලබාදීම

මෙම වර්ෂය තුල පිටපත් මුද්‍රණය සඳහා ණය පහසුකමක් ලබා දී නොමැත.

### 3.2.5 ප්‍රචාරක ණය පහසුකම් ලබාදීම

සංස්ථා (රිත්මා) මණ්ඩලය යටතේ 2016.12.20 වන දින ප්‍රදර්ශනය සඳහා මුදාහරින ලද **"සරිගම"** චිත්‍රපටය වෙනුවෙන් ප්‍රචාරක කටයුතු සඳහා රු.මි. 20 ක විශේෂ ණයක් ලබාදී ඇත .

### 3.2.6 උපශීර්ෂ පාඨ ණය පහසුකම් ලබාදීම

මෙම වර්ෂය තුල කිසිදු චිත්‍රපටයක් සඳහා උපශීර්ෂ පාඨ ණය පහසුකමක් ලබා දී නොමැත.

## 3.3 සිනමා ශිල්පීන් හා කාර්මික ශිල්පීන් ලියාපදිංචි කිරීම සහ කාර්මික හැඳුනුම්පත් නිකුත් කිරීම

වසර තුල රංගන හා කාර්මික ශිල්පීන් 24 දෙනෙකු වෙනුවෙන් නව හැඳුනුම්පත් නිකුත් කිරීම සිදුකර ඇත.

3.4 **දේශීය චිත්‍රපට නිෂ්පාදනය සඳහා විදේශීය නළු, නිළි, කාර්මික ශිල්පීන් යොදා ගැනීම වෙනුවෙන් අනුමත ගාස්තු අයකිරීම**

- ධර්මයුද්ධය චිත්‍රපටයෙහි අධ්‍යක්ෂ හා කැමරා අධ්‍යක්ෂ වෙනුවෙන් රු.500,000/- ක මුදලක් අයකර ඇත.

3.5 **දේශීය වෘතාන්ත /වෙළඳ වාර්තා වැඩසටහන් රූගත කිරීම සඳහා කැමරා උපකරණ විදේශිකයින් විසින් නැවත ගෙන යෑමේ පදනම මත අනුමත කිරීම වෙනුවෙන් කරනු ලබන අයකිරීම**

විදේශීය වෙළඳ වැඩසටහන් 05 ක් වෙනුවෙන් රු.25,000/- ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර ඇත.

3.6 **සුවිශේෂී කලාකරුවන් ඇගැයීම**

- චිත්‍රපට අධ්‍යක්ෂක හා රංගන ශිල්පී රෝයි ද සිල්වා මහතා වෙත දේශීය සිනමා කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් සිදුකරන ලද සේවය ඇගයීම වෙනුවෙන් රු.25,000/- ක මූල්‍ය පරිත්‍යාගයක් ලබා දීම.
- ප්‍රවීණ රංගන ශිල්පිනි සුමනා අමරසිංහ මහත්මිය වෙත රු.25,000/- ක මූල්‍ය පරිත්‍යාගයක් ලබාදීම.
- චිත්‍රපට අධ්‍යක්ෂක හා රංගන ශිල්පී සතිස්චන්ද්‍ර එදිරිසිංහ මහතාගේ කලා ජීවිතයට වසර 55 ක් සපිරීම වෙනුවෙන් ඒ මහතා වෙත රු.50,000/- ක මූල්‍ය පරිත්‍යාගයක් ලබාදීම.

**වෛද්‍යාධාර ලබාදීම**

**පහත සඳහන් ශිල්පීන් වෙත වෛද්‍යාධාර මුදල් ලෙස එක් අයෙකුට රු.50,000/- බැගින් වසර තුල ලබා දී ඇත.**

- ආලෝක ශිල්පී සිරිලාල් මහතා
- චිත්‍රපට අධ්‍යක්ෂක සිරිමල් විජේසිංහ මහතා
- චිත්‍රපට අධ්‍යක්ෂක දිනේෂ් ප්‍රියසාද් මහතා
- රංගන ශිල්පිනි චන්ද්‍රි රසිකා මහත්මිය
- රංගන ශිල්පී ආනන්ද වික්‍රමගේ මහතා
- ගායන ශිල්පී ප්‍රින්ස් උදයප්‍රියන්ත මහතා

අවමංගල්‍යාධාර

- ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රවීණ කලාකරු ආචාර්ය ඩී.බී.නිහාල්සිංහ මහතාගේ අභාවය වෙනුවෙන් ජාතික චිත්‍රපට සංස්ථාව රු.500,000/- ක මූල්‍ය පිරිවැයක් දැරීම.

**මීට අමතරව පහත ශිල්පීන් වෙනුවෙන් රු.50,000/- බැගින් අවමංගල්‍යාධාර ලබා දී ඇත.**

- ශබ්ද පරිපාලන සහ පසුබිම් ගීත පටිගත කිරීමේ ශිල්පී මර්වින් බෙන්ස් මහතා
- ප්‍රවීණ රංගන ශිල්පී විමල් කුමාර ද කොස්තා මහතා
- චිත්‍රපට අධ්‍යක්ෂක සිරි කුලරත්න මහතා
- ප්‍රවීණ සටන් අධ්‍යක්ෂක සරත් ද සිල්වා මහතා

## 3.7 චිත්‍රපට ආනයනය

වර්ෂය තුළ චිත්‍රපට ආනයනය සඳහා ලියාපදිංචි වූවන් සංඛ්‍යාව 24 කි.

ඒ අනුව, 2016 වර්ෂය තුල ප්‍රදර්ශන මණ්ඩල 05 මගින් දමිළ, ඉංග්‍රිසි, හින්දි සහ වෙනත් භාෂාමය චිත්‍රපට 119 ක් ආනයනය කිරීම සඳහා අනුමැතිය ලබාදී ඇත.

## 3.8 චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ සංස්ථා භාරය

### 3.8.1 විශ්‍රාම වැටුප් ගෙවීමඃ (එක් අයකුට රු.2,000/- බැගින්)

- ජනවාරි - මාර්තු (විශ්‍රාමිකයන් 58 දෙනෙකු වෙනුවෙන්) රු.116,000.00
- අප්‍රේල් - දෙසැම්බර් (විශ්‍රාමිකයන් 57 දෙනෙකු වෙනුවෙන්) රු.114,000.00

### 3.8.2 2016 වසර තුළ මියගිය විශ්‍රාමලාභින් ඃ

විශ්‍රාම වැටුප්ලාභී රංගන ශිල්පී තිස්ස උඩංගමුව මහතා මියගොස් ඇත.

## 3.9 ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල

### 3.9.1 සුවිශේෂ කලාකරුවන් ඇගැයීම.

- දේශීය සිනමාවේ උන්නතිය වෙනුවෙන් සිය රංගන දායකත්වය ලබාදුන් රංගන ශිල්පිනි එඩ්නා සුමතිපාල මහත්මිය වෙත සිය සේවය ඇගයීම වෙනුවෙන් රු.50,000/- ක හා මූල්‍ය පරිත්‍යාගයක් ලබාදීම.
- ආචාර්ය එඩ්වින් ආරියදාස මහතා කලා ක්ෂේත්‍රයෙහි විවිධ අංශ වෙත ලබාදෙන්නා වූ සේවය ඇගයීම සඳහා රු.50,000/- ක මූල්‍ය පරිත්‍යාගයක් ලබාදීම.

### 3.9.2 විදේශීය / වෘතාන්ත /වාර්තා /වෙළඳ වැඩ සටහන් රූගත කිරීම සඳහා අවසර ලබා දීම.

වසර තුළ වෘතාන්ත චිත්‍රපට, වාර්තා චිත්‍රපට සහ වෙළඳ වැඩසටහන් 68 ක් වෙනුවෙන් මුදල් අයකර අදාල අනුමැතිය ලබා දී ඇත.

# 04. පිරිස් හා ආයතන පාලනය

## 4.1 කාර්ය මණ්ඩලය

| | | | |
|---|---|---|---|
| 2016.01.01 දිනට සේවක සංඛ්‍යාව | - | | 132 |
| 2016 වර්ෂය තුල බඳවාගත් සංඛ්‍යාව | - | | - |

**2016 වර්ෂය තුල ඉවත් වු සංඛ්‍යාව**

| | | | |
|---|---|---|---|
| විශ්‍රාම ලැබූ සංඛ්‍යාව | - | 05 | |
| සේවයෙන් ඉල්ලා අස් වු සංඛ්‍යාව | - | 01 | |
| | | | 06 |
| | | | 126 |
| ස්ථිර කාර්ය මණ්ඩලය | - | | 126 |
| සභාපති | - | | 01 |
| ක්‍රියාකාරි අධ්‍යක්ෂ | - | | 01 |
| දෛනික දීමනා | - | | 01 |
| කොන්ත්‍රාත් | - | | 01 |
| 2016.12.31 දිනට මුළු සේවකයන් | - | | 130 |

### 4.2 ආයතන පාලනය හා සේවක අවශ්‍යතා ඉටු කිරීම.

ආයතනයේ සේවක පාලනයට අදාලව අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග ඉදිරියට ගෙනයමින් සේවා කටයුතු ඉටු කර ඇත.

## 05. චිත්‍රපට ප්‍රචාරණය / සිනේ ඇඩ්

### 5.1 වසර තුල ඉටුකල කාර්යයන්

#### 5.1.1 දේශීය ලෙස ප්‍රදර්ශනයට මුදා හරින ලද සිංහල චිත්‍රපටවල මුද්‍රිත ප්‍රචාරක කටයුතු

| | | | |
|---|---|---|---|
| i | සුහඳ කොකා | ii | හොරා පොලිස් |
| iii | නටන් නැතුව දින්නා | iv | සුජාත පුත්‍ර |
| v | වීරවර්ණ | vi | රජා මමයි |
| vii | සක්කාරං | viii | මෝටර් බයිසිකල් |

#### 5.1.2 ආනයනය කරන දමිළ, ඉංග්‍රිසි හා හින්දි චිත්‍රපට වල මුද්‍රිත ප්‍රචාරක කටයුතු

| | | | | | |
|---|---|---|---|---|---|
| i | Bajiro Mastani | ii | Saala Khadoos | iii | Neerja |
| iv | Waziy | v | Fitoor | vi | Dhanak |
| vii | Kapool & Sons | viii | House Full III | ix | Kabali |
| x | Dishoom | xi | Pink | xii | M.S.Doni |
| xiii | Irumugal | ivx | Thodavi | | |

#### 5.1.3 මාධ්‍ය ප්‍රචාරක කටයුතු

**පහත කටයුතු වලට අදාල මුද්‍රිත හා මාධ්‍ය ප්‍රචාරක කටයුතු සිදුකොට ඇත.**

- දේශීය සිනමාවේ 69 වන සමරුව හා ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 44 වන සමරු උළෙල
- ජලයෙන් යටවු **ලින්චිගේ ලෝකය** ග්‍රන්ථය දොරට වැඩීම වෙනුවෙන් කොළඹ ජයවර්ධන කේන්ද්‍රයේ පැවැති සිනමා සම්මන්ත්‍රණය
- සංස්ථාව මගින් දීප ව්‍යාප්තව පවත්වන **"ජීවිතයට සිනමාව"** සිනමා වැඩසටහන
- **"අනුභූත උත්තර සිනමාව හා සිනමා පවුල "** යන තේමාව යටතේ පැවැති සිනමා කතිකාව

- රෝයල් තායි තානාපති කාර්යාලය මඟින් පවත්වන ලද තායි චිත්‍රපට උළෙල

- ලංකාවේ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය, ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය හා ඒකාබද්ධව සංවිධානය කරන ලද සරණාගතයන් පිළිබඳ චිත්‍රපට උළෙල

- අප්‍රේල් මාසයේ පැවැති ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් උපන්දින උත්සවය වෙනුවෙන් දොරට වැඩි සිනමා කෘතිය

- ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව ආරම්භ කල සිනමාකරණ ඩිප්ලෝමා පාඨමාලාවට අදාලව

- 2016 වර්ෂයේ ප්‍රදර්ශනය කල දේශීය චිත්‍රපට 09 ක සහ ආනයනය කල විදේශීය චිත්‍රපට 17 ට අදාලව

<u>වෙනත්</u>

- ආයතනයේ සිදුවන ක්‍රියාකාරකම් පිළිබඳ මාධ්‍ය දැනුවත් කිරීම් කටයුතු

- 2015 ජනාධිපති සිනමා සම්මාන උළෙල (සිනමා ජූරියේ) චිත්‍රපට නැරඹීම් සහය කටයුතු

## 06. <u>චිත්‍රපට ප්‍රදර්ශනය</u>

### 6.1 සංස්ථා ප්‍රදර්ශන මණ්ඩලය (රිත්මා එන්ටර්ප්‍රයිසස්)

- 2016 වර්ෂය තුලදි රිත්මා මණ්ඩලය යටතේ සිනමාශාලා 59 ක් ක්‍රියාත්මක විය.

- තාවකාලිකව වසා තබන ලද චුන්නාකම් - නහම්ස් සිනමාශාලාව 2016 වර්ෂයේ නැවත චිත්‍රපට ප්‍රදර්ශන කටයුතු ආරම්භ කර ඇත.

### 6.2 චිත්‍රපට මුදාහැරීම

- සිනමාශාලා 59 ක් සඳහා රිත්මා මණ්ඩලය විසින් චිත්‍රපට මුදාහැර ඇත.
- 2016 වර්ෂය තුළ රිත්මා මණ්ඩලය හා අනෙකුත් මණ්ඩල සමඟ ඒකාබද්ධ වී චිත්‍රපට මුදාහැරීමට කටයුතු කර ඇත.
- රිත්මා මණ්ඩලය මගින් සිංහල චිත්‍රපට 06 ක් මුදාහැරීමට කටයුතු කර ඇත.

- මෙම වර්ෂයේ ජනවාරි සිට සැපයුම්කරුවන් විසින් ආනයනය කරන ලද දෙමළ චිත්‍රපට 29 ක් හා හින්දි චිත්‍රපට 14 ක් රිත්මා මණ්ඩලයේ හා අනෙකුත් මණ්ඩලවල සිනමා ශාලාවන් හා ඒකාබද්ධ වී මුදාහැරීමට කටයුතු කර ඇත.
  (සංස්ථා මණ්ඩලය වෙත ලබා දී ඇති කොටසින් (කෝටා) හා අනෙකුත් මණ්ඩල කොටස් වලින් (කෝටා) චිත්‍රපට ලබාගෙන රිත්මා මණ්ඩලය විසින් මුදාහැරීමට කටයුතු කර ඇත.)

- චිත්‍රපට ධාර 3 ක ක්‍රමවේදයක් සකස් කර වැඩි සිංහල චිත්‍රපට ප්‍රමාණයක් මුදාහැරීමට අදාලව වැඩි ඉඩකඩක් ලබා දීම.

## 6.3 චිත්‍රපට කුලිය

අප මණ්ඩලය විසින් අනෙකුත් මණ්ඩලවලට සපයන ලද චිත්‍රපට සඳහා පහත සඳහන් පරිදි චිත්‍රපට කුලී මුදල් ලැබී ඇත. (2016 ජූලි මස දක්වා)

- ලංකා ෆිල්ම්ස් ඩිස්ට්‍රිබියුටර්ස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් -රු. 1,326,385.02
- මූවි ප්‍රඩියුසර්ස් ඇන්ඩ් ඉම්පෝටර්ස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් -රු. 698,960.76 (2016 මාර්තු මස දක්වා පමණි)
- සිනමා එන්ටර්ටේට්මන් (ප්‍රයිවට්) ලිමිටඩ් -රු. 5,275,957.72
- ඊ.ඒ.පී.ෆිල්ම්ස් ඇන්ඩ් තියටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් -රු. 2,498,531.47

අප මණ්ඩලය අනෙකුත් මණ්ඩල වලින් ලබාගත් චිත්‍රපට සඳහා පහත සඳහන් පරිදි මුදල් ගෙවා ඇත. (2016 ඔක්තොම්බර් මස දක්වා)

- ලංකා ෆිල්ම්ස් ඩිස්ට්‍රිබියුටර්ස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් -රු. 3,407,077.46
- මූවි ප්‍රඩියුසර්ස් ඇන්ඩ් ඉම්පෝටර්ස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් -රු. 3,438,348.98
- සිනමා එන්ටර්ටේට්මන් (ප්‍රයිවට්) ලිමිටඩ් -රු.30,179,915.80
- ඊ.ඒ.පී.ෆිල්ම්ස් ඇන්ඩ් තියටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් -රු.38,669,373.52

- රිපෝ තැන්පතු

  2016 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා රු.58,000,000.00 ක තැන්පතු ඇත.

2016 වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් මස දක්වා කොමිස් මුදල් ආදායම රු.32,515,829,46 වේ.

- 2016 වර්ෂය තුල විවිධ සමිති සමාගම් හා විශ්ව විද්‍යාල හා පාසැල් සිසුන් සඳහා සහන මිලක් යටතේ ආධාර ලබා ගැනීම සඳහා චිත්‍රපට ලබාදීම.

- පොලිස් අභ්‍යාස විද්‍යාල සඳහා හා හමුදා කඳවුරු සඳහා සහන මිලකට හා නොමිලේ චිත්‍රපට ලබා දීම.

## 07. <u>අභ්‍යන්තර විගණන කටයුතු</u>

අභ්‍යන්තර විගණන කටයුතු 1971 අංක 38 දරණ මුදල් පනතේ විධි විධාන වලට අනුකූලව හා විගණකාධිපතිගේ අවධානයට යටත්ව සිදුකර ඇත.

වර්ෂය තුල ක්‍රියාත්මක විගණන හා කළමනාකරණ කමිටුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

| | |
|---|---|
| එන්.ගොඩකන්ද මිය | - මහා භාණ්ඩාගාරයේ නියෝජිත - කමිටු සභාපති |
| ඩබ්.ශ්‍රියානි හංවැල්ල මිය | - අභ්‍යන්තර විගණක - කමිටු ලේකම් |
| විශේෂඥ වෛද්‍ය අනිල් සමරනායක | - කමිටු සාමාජික |
| ආචාර්ය එස්.කේ.එම්.දර්ශනි ගුණතිලක | - කමිටු සාමාජික |
| අමල් අල්විස් මහතා | - කමිටු සාමාජික |
| එන්.පී.කුමාරි මිය | - අධීක්ෂණ නිලධාරි විගණකාධිපති දෙපාර්තමේන්තුව |

වසර තුළ විගණන හා කළමනාකරණ රැස්වීම් වාර 02 ක් පවත්වා ඇත.

## 8. සිනමා සංස්කෘතික හා අධ්‍යාපන කටයුතු

### 8.1 "ජීවිතයට සිනමාව" සිනමා රසවින්දන වැඩසටහන්

| | දිනය | වැඩසටහන | ස්ථානය | සහභාගිත්ව ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 | 2016.02.24 | චිත්‍රපට රසවින්දන වැඩමුළුව | හොරණ ශ්‍රීපාලි විද්‍යාලය | 100 |
| 2 | 2016.03.14 | ,, | ADIC ආයතනය, කොළඹ 05 | 60 |
| 3 | 2016.03.29 | ,, | බලංගොඩ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය | 70 |
| 4 | 2016.05.25 | ,, | දිඹුලාගල අධ්‍යාපන කොට්ඨාශය, වැලිකන්ද | 150 |
| 5 | 2016.06.05 | ,, | රතුකුරුස ශ්‍රවනාගාරය - හලාවත | 70 |
| 6 | 2016.06.06 | ,, | මයුරපාද විද්‍යාලය - නාරම්මල | 200 |
| 7 | 2016.07.15 | ,, | අඹේපුස්ස බන්ධනාගාරය | 60 |
| 8 | 2016.08.25 | ,, | වරකාපොල කාර්මික විද්‍යාලය | 60 |
| 9 | 2016.10.19 | ,, | කුලියාපිටිය මධ්‍ය විද්‍යාලය | 200 |
| 10 | 2016.10.20 | ,, | ඩී.එස්.සේනානායක විද්‍යාලය - කොළඹ | 200 |
| 11 | 2016.11.29 | ,, | කෑ/කෑගලු බාලිකා විද්‍යාලය | 200 |

### අධ්‍යාපනික චිත්‍රපට ප්‍රදර්ශන

| | දිනය | වැඩසටහන | ස්ථානය | සහභාගිත්ව ප්‍රමාණය |
|---|---|---|---|---|
| 12 | 2016.01.12 | චිත්‍රපට ප්‍රදර්ශනය | බිලුමැන්ඩල් සංහල කණිෂ්ඨ විද්‍යාලය | 100 |
| 13 | 2016.03.02 | | කිරිල්ලවල මධ්‍ය මහා විද්‍යාලය | 100 |
| 14 | 2016.03.14 | | පොලිස් අපරාධ විමර්ශන කොට්ඨාශය | 70 |
| 15 | 2016.05.23 | | පරම විචිත්‍රානන්ද මහා විහාරය - ගාල්ල | 200 |
| 16 | 2016.06.21 | | වාරියපොල ශ්‍රී සුමංගල මධ්‍ය මහා විද්‍යාලය | 250 |
| 17 | 2016.06.06,07,08 | | මහින්ද විද්‍යාලය - ගාල්ල | 200 |
| 18 | 2016.07.19 | | බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 200 |
| 19 | 2016.07.29 | | විහාරමහා දේවි බාලිකා විද්‍යාලය - කිරිබත්ගොඩ | 100 |
| 20 | 2016.08.05 | | පොලිස් අපරාධ වාර්තා කොට්ඨාශය - කොළඹ 07 | 70 |
| 21 | 2016.09.08 | | ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාලය - හතරලියද්ද | 60 |
| 22 | 2016.09.06,07,08 | | වයඹ විශ්වවිද්‍යාලය - කුලියාපිටිය | 100 |
| 23 | 2016.09.24 | | සංස්කෘතික මධ්‍යස්ථානය - ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | 125 |
| 24 | 2016.09.07 | | සීතාවක ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | 70 |

| | | | | |
|---|---|---|---|---|
| 25 | 2016.08.25 | | තාක්ෂණික විද්‍යාලය - වරකාපොල | 70 |
| 26 | 2016.09.30 | | ආරක්ෂක සේවා විද්‍යාලය - කොළඹ 02 | 70 |
| 27 | 2016.12.16 | | කොබවක ගෝවින්න සුමනාරාම විහාරය | 100 |

<u>සිනමා කතිකාව</u>

| | දිනය | වැඩසටහන | ස්ථානය | සහභාගිත්ව ප්‍රමාණය |
|---|---|---|---|---|
| 28 | 2016.05.05 | සිනමා කතිකාව - "අනුභූති උත්තර සිනමාව" | සංස්ථා සිනමාශාලාව | 200 |
| 29 | 2016.06.30 | සිනමා කතිකාව - "සිනමාව හා පවුල" | සංස්ථා සිනමාශාලාව | 250 |

8.2 සිනමාකරණ ඩිප්ලෝමා පාඨමාලාව 2016/2017

- පළමු වාර පරික්ෂණය සිදුකර ඇත.

8.3 2016 වර්ෂයේ "චිත්‍රපට සඟරාව" ප්‍රකාශයට පත් කිරීම

- ජනවාරි - අප්‍රේල් කළාපය
- මැයි - අගෝස්තු කළාපය
- සැප්තැම්බර් - දෙසැම්බර් කළාපය නිකුත් කර ඇත.

- සිනමා පුස්තකාලය සඳහා ග්‍රන්ථ 20 ක් පමණ අලුතින් ලබාගෙන ඇත.
- ලෝක සිනමාව තුල සම්මානයට පාත්‍ර වූ චිත්‍රපට 20 ක් සිනමා පුස්තකාලය සඳහා ලබාගෙන ඇත.

**9. <u>දේශීය සැපයුම් ආනයනය හා අපනයනය</u>**

- සිනමාශාලා හිමියන් සහ සංස්ථාවේ අවශ්‍යතාවයන් පරිදි කාර්මික උපකරණ හා කාර්යාලීය ලිපිද්‍රව්‍ය හා උපකරණ නියමිත ක්‍රමවේදයන්ට අනුව මිලදී ගෙන සැපයීම.
- සංස්ථා නව කාර්යාල ගොඩනැගිල්ල අංශ වලට බෙදා වෙන් කිරීම
- සංස්ථා සිනමා ශාලාව අංකිත තාක්ෂණයට පරිවර්තනය කිරිමේ කටයුතු.
- අදාල නියෝජිත ආයතන සමග භාණ්ඩ හා සේවාවන්ට අදාල සේවා ගිවිසුම් යාවත්කාලිනව පවත්වාගෙන යාම.

## 10. චිත්‍රපට ගබඩාව

### 10.1 කාර්ය භාරය

- චිත්‍රපට සංස්ථාවේ අවසරය මත ආනයනය කරනු ලබන විදේශීය චිත්‍රපට හා දේශීයව නිකුත් කරනු ලබන චිත්‍රපට භාරගෙන ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම.

- එම චිත්‍රපට භාරගෙන තත්ත්ව පරීක්ෂාකර රඟුම් පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම, තත්ත්ව වාර්තා ලබා ගැනීම තුලින් සංස්ථාවට ආදායමක් ලැබීමට සැලැස්වීම. රඟුම් පාලක මණ්ඩලයේ අනුමැතිය පරිදි නැවත තත්ත්ව වාර්තා ලබාගෙන ආනයනකරු / නිෂ්පාදක බෙදාහැරීම් මණ්ඩලයට භාරදීම හෝ සිනමාශාලා වෙත බෙදාහැරීම.
- සංස්ථා මණ්ඩලය මඟින් අනුපෙළ ගන්වනු ලබන චිත්‍රපට නියමිත සිනමාශාලා වෙත දුම්රියෙන් සහ අතින් චිත්‍රපට යැවීම හා නිසි පරිදි ගෙන්වා ගැනීම.

- එම චිත්‍රපට වලට අදාල පූර්ව ප්‍රචාරක පට හා ද්‍රව්‍ය සිනමාශාලා වෙත කල්වේලා ඇතිව යැවීම.
- චිත්‍රපට ගබඩාව වෙත ලැබෙන සියලු චිත්‍රපට නැවත පරීක්ෂා කොට රාක්කගත කිරීම.

- රාක්ක ගතකර ඇති චිත්‍රපට වරින් වර පරීක්ෂාවට ලක් කිරීම.
- චිත්‍රපට තත්ත්ව පරීක්ෂාවෙන් උපයා ඇති මුදල ලක්ෂ 10 ක් පමණ වේ.

- චිත්‍රපට ගබඩාවේ ඇති පැරණි චිත්‍රපට ප්‍රතිසංස්කරණය කර නැවත ප්‍රදර්ශනයට සුදුසු ආකාරයෙන් සකස් කිරීම හා සංස්ථාව වෙත ආදායමක් උපයා දීම.

- පැරණි චිත්‍රපට වලින් ධාවනයට සුදුසු පිටපත් 03 ක් පමණක් ගබඩාවේ රඳවා ඉතිරි වන සියලු චිත්‍රපට අයිතිකරුවන් වෙත භාරදීම මඟින් චිත්‍රපට ගබඩාවේ නඩත්තු කටයුතු ක්‍රමවත්ව කිරීම.

- චිත්‍රපට ගබඩාවේ ගොඩගසා ඇති ගිවිසුම් කාලය අවසන් වු චිත්‍රපට හා අබලන් චිත්‍රපට අයිතිකරුවන් වෙත දන්වා යැවීමෙන් පසු නිසි ක්‍රමවේදයට අනුකූලව පිලිස්සීමට කටයුතු යෙදීමත් එහිදි ඉතිරිවන අළු අලෙවි කර සංස්ථාව වෙත ආදායමක් ලබා ගැනීමට කටයුතු කිරීම.
- සිංහල චිත්‍රපට 15 ක් (මි.මී. 35) ලියාපදිංචි කර ඇත.

- අධි ලේඛනාගාරයේ තැන්පත්කර ඇති සිංහල චිත්‍රපට තත්ත්ව පරීක්ෂා කිරීමට කටයුතු කිරීම.

## 11. නෛතික කටයුතු

### 11.1 කාර්ය භාරය

- සංස්ථාව පාර්ශවයක් වන නඩු සම්බන්ධයෙන් සංස්ථාව වෙනුවෙන් පෙරකලාසි ගොනු කිරීම හා අදාල අධිකරණයේ සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම.

- කම්කරු දෙපාර්තමේන්තුව ඉදිරියේ කම්කරු ආරවුල් සඳහා සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම.

- ජාතික චිත්‍රපට සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන චිත්‍රපට, ආනයනය කරනු ලබන චිත්‍රපට, චිත්‍රපට බෙදාහැරීම සම්බන්ධයෙන් සහ චිත්‍රපට නිෂ්පාදනය / චිත්‍රාගාර සේවා / පිටපත් මුද්‍රණය / උපශීර්ෂ පාඨ යෙදීම / ප්‍රචාරක කටයුතු සඳහා ණය මුදල් ලබාදීම සහ සේවා සැපයීමේ සියලුම නීත්‍යානුකූල ගිවිසුම් සකස් කිරීම සහ අත්සන් තැබීම.
- ජාතික චිත්‍රපට සංස්ථාවට උපකාරක සේවා ලබාගැනීම සහ වෙනත් කටයුතු සම්බන්ධයෙන් සියලුම නීත්‍යානුකූල ගිවිසුම් සකස් කිරීම හා අත්සන් තැබීම.

- එදිනෙදා අවශ්‍යතාවය පරිදි සංස්ථාවේ ඕනෑම අංශයකින් යොමුකරන නීතිමය ගැටලු සඳහා උපදෙස් ලබාදීම.

### 11.2 අධිකරණ කටයුතු

#### 11.2.1 2016 වර්ෂය තුල ක්‍රියාත්මක වෙමින් පැවති හා පවතින නඩු පිළිබඳ විස්තර

1. අභියාචනාධිකරණ නඩු අංක : 870/99

2. කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක : 97659/5/11

3. දිසා අධිකරණ නඩු අංක : DMR 1126/2012 – සිනේ සිටි සිනමාශාලා 4 න් සංස්ථාවට ගෙවිය යුතු සංස්ථා භාරය නොගෙවීම සම්බන්ධයෙන් සංස්ථාව විසින් නඩු පවරන ලදි.

4. කොළඹ දිසා අධිකරණ නඩු අංක : DSP/00026/2013, DSP/00027/2013, DSP/00028/2013, DSP/00029/2013, DSP/00030/2013
5. අභියාචනාධිකරණ පෙත්සම් අංක : CA(Writ) Application No : 144/2013

6. කම්කරු විනිශ්චය සභා නඩු අංක : 13/41/2013

7. කම්කරු විනිශ්චය සභා නඩු අංක : 2/435/2014

8. DMR 2603/2013 වලාපටල චිත්‍රපටය

9. CHC 370/2014 සුභා චිත්‍රපටය

10. කොළඹ දිසා අධිකරණ නඩු අංක : DSP 140/2015

11. කොළඹ දිසා අධිකරණ නඩු අංක : DSP 00128/2016

12. කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක : MC 30392/5

13. කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක : 47446/1/16

14. ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක : HCCA/LA 181/2016

15. කම්කරු දෙපාර්තමේන්තුවේ පැවැති පරීක්ෂණ

    I කම්කරු කාර්යාලය පැමිණිලි අංකය : IR/15/19/2012 – සංස්ථා සේවක සමිත දිසානායක මහතා

    II කම්කරු කාර්යාලය පැමිණිලි අංකය : CC/C/EPF/583/2015 - සංස්ථා සේවක කේ.එච්.නිලන්ත් ප්‍රසාද් මහතා

## 12. මූල්‍ය කටයුතු

### 12.1 ආදායම් ප්‍රභවයන්

| ආදායම | 2015 සත්‍ය රු.මි. | 2016 සත්‍ය රු.මි. | වැඩිවීම/ අඩුවීම % | 2016 අයවැය රු.මි. |
|---|---|---|---|---|
| බෙදාහැරීමේ කොමිස් - දේශීය | 18.9 | 15.7 | (16.9) | 18 |
| විදේශීය | 16.7 | 21.4 | 28.1 | 12.5 |
| වැඩිවීම (සංස්ථා භාරය) | 7.8 | 8.3 | 6.4 | 8 |
| අධිභාර පරීක්ෂණ දඩ මුදල් හා වෙනත් | 3.8 | 5.9 | 55.3 | 5.1 |
| සිනේ ඇඩ්ස් කොමිස් | 0.4 | 0.5 | 25 | 0.4 |
| චිත්‍රාගාරයේ ආදායම | 2.3 | 2.4 | 4.3 | 2.05 |
| වෙළඳ කටයුතු | 3.7 | 3.3 | (10.8) | 3.05 |
| මෙහෙයුම් ආදායම් | 53.6 | 57.5 | 7.3 | 49.1 |
| වෙනත් ආදායම් | 48.7 | 62.1 | 27.5 | 68.32 |
| භාණ්ඩාගාරයෙන් පුනරාවර්ථන වියදම් සඳහා ලැබීම් | 80 | 74.3 | (7.1) | 101 |
| මුළු ලැබීම් | 182.3 | 193.9 | 6.4 | 218.42 |

2015 වර්ෂයට සාපේක්ෂව සලකා බැලීමේදි ආදායම 2016 වර්ෂයේදී මෙහෙයුම් ආදායම 7.3% ක වැඩිවීමක් පෙන්වා ඇත. විදේශීය බෙදා හැරීම් කොමිස් 28.1% ක ඉහළ යාම මෙම වැඩිවීම් වලට ප්‍රධාන හේතුව වේ.

අධිභාර, පරීක්ෂණ දඩ මුදල් හා වෙනත් ආදායම් 55.3% කින් වැඩිවීම සමස්ථ ආදායම වැඩිවීමට බලපා ඇත. තව ද, වෙනත් ආදායම් 27.5% කින් වැඩිවීම සමස්ත ආදායම වැඩිවීමට බලපා ඇත.

12.2 **වියදම් ප්‍රභවයන්**

| වියදම | 2015 සත්‍ය රු.මි. | 2016 සත්‍ය රු.මි. | වැඩිවීම/ අඩුවීම % | 2016 අයවැය රු.මි. |
|---|---|---|---|---|
| සේවක පාරිශ්‍රමික | 77.6 | 80 | 3.09 | 94.5 |
| ගමන් හා යැපීම් දීමනා | 0.4 | 1.7 | 325 | 2 |
| සැපයුම් හා උපකරණ | 6 | 7.4 | 23.33 | 4 |
| අළුත්වැඩියා කිරීම් හා නඩත්තු ක්ෂයවීම් | 28.4 | 29.7 | 4.58 | 5 |
| ජාතික චිත්‍රපට උත්සව | - | 5 | 100 | - |
| විකුණුම් පිරිවැය | 2.9 | 2.7 | (6.90) | 3 |
| ප්‍රවාහන සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් | 14.4 | 17.3 | 20.14 | 42 |
| බොල් ණය වෙන් කිරීම | 11 | 2.9 | (73.64) | 5 |
| පාරිතෝෂික වෙන් කිරීම | 20.5 | 7.1 | (65.37) | 5 |
| චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල | 0.2 | 0.5 | 150 | 2 |
| මුළු ලැබීම් | 161.4 | 154.3 | 4.40 | 158 |

2015 වර්ෂයට සාපේක්ෂව විකුණුම් පිරිවැය 6.9% කින් ද, බොල් ණය වෙන් කිරීම 73.64% කින් හා පාරිතෝෂික වෙන් කිරීම 65.37% අඩුවීම සමස්ත වියදම අඩුවීමට බලපා ඇත.

| | 2015 රු.මි. | 2016 රු.මි. |
|---|---|---|
| මෙහෙයුම් ආදායම | 53.6 | 57.5 |
| මෙහෙයුම් වියදම | 161.5 | 154.3 |
| මෙහෙයුම් ලාභය / අලාභය | (107.9) | (96.8) |
| වෙනත් ආදායම් | 48.7 | 62.1 |
| වර්ෂයේ ලාභය / අලාභය | (59.1) | (34.7) |
| පුනරාවර්තන වියදම් - ලැබීම් (භාණ්ඩාගාරයෙන්) | 80 | 74.3 |
| අතිරික්තය | 20.9 | 39.6 |

2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී මෙහෙයුම් අලාභය 11.13% කින් අඩු වී ඇත. වෙනත් ආදායම ද 27.51% කින් වැඩි වී ඇත. එම නිසා 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ අලාභය 41.45% කින් අඩු වී ඇත. පුනරාවර්තන ලැබීම් ගැලපීමෙන් පසු 2015 වර්ෂයට වඩා 2016 වර්ෂයේ 90% කින් අතිරික්තය වැඩි වී ඇත. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ, 2015 වර්ෂයට වඩා 2016 වර්ෂයේදී මෙහෙයුම් ආදායම වැඩිවීම හා 2015 වර්ෂයට වඩා මෙහෙයුම් වියදම අඩුවීමයි.

12.3 **ස්ථාවර වත්කම්**

මෙම වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සඳහා ඇස්තමේන්තුගත මුදල වූ රු.මි. 20 ක මුදලක් භාණ්ඩාගාරයෙන් ලබා දී ඇත.

2016 වර්ෂයේ ප්‍රක්ෂේපණ යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම සඳහා රු.මි. 0.4 ක් ද, නව ගොඩනැගිල්ල බෙදා වෙන් කිරීම සඳහා රු.මි. 6.7 ක මුදලක් ද වැය කර ඇත. මෙම වර්ෂය සඳහා ක්ෂය කිරීම් රු.මි. 22 ක් වේ.

12.4 **ජංගම වත්කම්**

පසුගිය වර්ෂයට සාපේක්ෂව සලකා බලනවිට ජංගම වත්කම් රු.මි.98 කින් වැඩි වී ඇත. කෙටිකාලීන අයෝජන 2015 වර්ෂයට වඩා රු.මි.76 කින් වැඩිවූයේ ආයෝජනය කර ඇති තැන්පතු සඳහා ලැබෙන පොලිය නැවත ආයෝජනය කිරීම සහ රිපෝ තැන්පතු මිලදී ගැනීම වේ.

තරංගනි සිනමාශාලාව සඳහා ශබ්ද උපකරණ කට්ටලයක් සවි කිරීම නිසා තොගය රු.මි.2.9 කින් අඩු වී ඇත.

**12.5** **ජංගම වගකීම**

චිත්‍රපට කුලී ණය හිමියන් පසුගිය වර්ෂය සමග සැසඳීමේදි රු.මි.49 කින් වැඩි වී ඇත.

## 13 <u>චිත්‍රාගාරය</u>

පශ්චාත් නිෂ්පාදන අදියරේ පවතින චිත්‍රපට සඳහා කාර්මික සේවාවන් සහ පහසුකම් සැපයීම චිත්‍රාගාරයේ ප්‍රධාන කාර්යය භාරය වේ.

ඒ අනුව, සුපුරුදු පරිදි 2016 වසරේදීත් චිත්‍රාගාරයේ පහත සඳහන් අංශ වලින් දේශීය චිත්‍රපට නිෂ්පාදකවරුන්ට අවශ්‍ය කාර්මික සේවාවන් සහ පහසුකම් සපයා ඇත.

1. ශබ්ද අංශය (Digital)
2. අරේඛීය සංස්කරණ අංශය (Digital)
3. චිත්‍රපට හා රූපවාහිනි රූපගත කිරීමේ මැදිරිය

## 13.1 ඉටු වී ඇති කාර්යයන්

1 සරසවි චිත්‍රාගාරය විසින් චිත්‍රපට කර්මාන්තයට ලබාදෙන කාර්මික පහසුකම් අනුව දේශිය චිත්‍රපට 24 ක් පමණ සඳහා ශබ්ද අංශයෙන් හා චිත්‍රපට 06 ක් සඳහා රේඛීය නොවන සංස්කරණ අංශයෙන් කාර්මික සේවාවන් මෙම කාලය තුල ලබාදී ඇත.

2 චිත්‍රපට සහ රූපවාහිනි වැඩසටහන් රූගත කිරීම සඳහා වන පහසුකම් චිත්‍රාගාරයේ අභ්‍යන්තර මැදිරිය සහ චිත්‍රාගාර ආලින්දයේ මෙන්ම උද්‍යානය තුලදි ලබා දී ඇති අතර, අදාල කාලය තුළ චිත්‍රපට 08 ක් ද රූපවාහිනි වැඩසටහන් 12 ක් සඳහා ද රූගත කිරීමේ පහසුකම් ලබා දී ඇත.

3 චිත්‍රාගාරයේ ශබ්ද අංශයේ එක් මැදිරියක් ජාත්‍යයන්තර ප්‍රමිතීන්ට අනුව බහුමාන ශබ්ද පටිගත කිරීම සඳහා නවීකරණය කිරීම.

දැනට චිත්‍රාගාරය විසින් දේශීය සිනමා කර්මාන්තයට ලබාදෙන මූලික චිත්‍රපට පශ්චාත් නිෂ්පාදන කාර්මික පහසුකම් (Basic Film Postproduction Facilities) ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව යාවත්කාලින (Upgrade) කිරීම.

ඉන්දියානු ශබ්ද උපදේශක වී.කිෂෝර් මහතාගේ කාර්මික උපදෙස් මත සිදුකරන මෙම ව්‍යාපෘතිය සඳහා මිල ගණන් කැඳවා ටෙන්ඩර් ප්‍රදානය සඳහා අවශ්‍ය කරන මූලික කටයුතු සිදුකර ඇතය.

4 චිත්‍රාගාරයේ ඩිජිටල් සංස්කරණ අංශය සඳහා නවීන තාක්ෂණානුකුල නව සංස්කරණ පද්ධතියක් මිලදි ගෙන උසස් තත්ත්වයේ වර්ණ නිවැරදි කිරීමේ (Color Correction) සහ ත්‍රිමාණ රූප නිර්මාණය කිරීමේ (Computer generated image) තාක්ෂණය වැඩි දියුණු කිරීම.

ඉහල විභේදනයන් 2K, 4K high resolution සහිත මාධ්‍ය සංස්කරණය කිරීම. චිත්‍රපටයක් මුද්‍රණය කිරීමට පෙර වර්ණ නිවැරදි (Color Correction) කිරීම සහ පරිගණක ආශ්‍රිත රූප නිර්මාණය කිරීම (Computer generated image) මූලික කරගනිමින් දේශිය සිනමා කර්මාන්තයට අවශ්‍ය ලෙස මෙම අංශය යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලදි ගැනීම.

මෙම ව්‍යාපෘතිය සඳහා මිල ගණන් කැඳවා ටෙන්ඩර් ප්‍රදානය කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදුකර ඇත.

5 ජාතික චිත්‍රපට පාසලක් (National Film Academy) චිත්‍රාගාර භූමිය තුළ ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය මූලික සැලසුම් සකස් කර ඇත.

### 13.2 චිත්‍රාගාරයේ පශ්චාත් කාර්මික සේවාවන් ලබාගත් චිත්‍රපට - 2016

**ශබ්ද අංශය**

1. අතුරු මිතුරු හරි අපූරු
2. හෝ ගානා පොකුණ
3. වෙස්වළාගත් තරුණිය
4. ආදර කතාවක්
5. හීන හොයන සමනල්ලු
6. කොට උඩ එක්ස්ප්‍රස්
7. රන්සයුර
8. ඩොක්ටර් නවරියන්
9. වීරවර්ණ
10. බඹර වසන්තය
11. The great elephant gather of Sri Lanka
12. The Undecided
13. කෝමලි කිංග්
14. Breaking News
15. Jobless Douglas
16. අප්පට සිරි
17. Sons & Fathers
18. හැට හතර මායං
19. පුංචි වීරයෝ
20. පුංචි අන්දරේ
21. ආදරෙයි තාමත් උසස්පෙළට
22. එල ඩබල
23. අලි කතාව
24. SLF – Practical Lessons

**රේඛීය නොවන සංස්කරණ අංශය**

1. කොට උඩ එක්ස්ප්‍රස්
2. පිළිකඩතුරාව
3. සුරඟනා
4. නටන්නැතිව දින්නා
5. රජානෝ
6. ඇදුරු වෙදදුරු පුදමු නමදිමු

**චිත්‍රාගාරයේ රූගත කළ චිත්‍රපට / රූපවාහිනි වැඩසටහන් - 2016**

1. Derana – Dell Studio
2. රුචිරාණෙනියේ ගීතය
3. කොට උඩ එක්ස්ප්‍රස් චිත්‍රපටය
4. Derana Little Star – Season 08
5. Asia Broadcasting (Pvt) Ltd. – Hiru Unplugged
6. බරතලී චිත්‍රපටය
7. Raigam- Gemak nethi Show

8. යම රජ සිරි - චිත්‍රපටය
9. Sons & Father
10. උදුරු වෙදුරු පුදමු නමදිමු
11. EAP Network (pvt.) Ltd Swarnawahini – Tokyo Cement All Island School quiz – Season 03.
12 පැදුරු සාදය
13 හෙලෝ මිස්ටර් මං ඩිරෙක්ටර් චිත්‍රපටය
14 සුනිල් එදිරිසිංහ මහතා - ගීතය
15 EAP Network (pvt.) Ltd Swarnawahini – Mareena Rasa Saraniya – Star Chef Hunt
16 RDB bank – ලෝක ළමාදින වැඩසටහන
17 අලි කතාව චිත්‍රපටය
18 අලුත් කතාවක්
19 නව දෙමෝදර පාලම
20 අනෝරා චිත්‍රපටය

### 13.3 වර්ෂය තුළ චිත්‍රාගාරයේ ලැබීම්

| | | රු. |
|---|---|---|
| ශබ්දාගාර පහසුකම් | - | 2,346,750.00 |
| සංස්කරණ පහසුකම් | - | 137,675.00 |
| රූගත කිරීම් | - | 4,452,118.15 |
| **එකතුව** | - | **6,936.543.15** |

## 14. පරීක්ෂණ කටයුතු

### 14.1 වර්ෂය තුල පරීක්ෂණ අංශය විසින් ඉටු කරන ලද කාර්යයන්

- සිනමාශාලා ඉදිරිකිරීම සඳහා ඉඩම් ගොඩනැගිලි පිළිබඳ තොරතුරු රැස්කිරීම
- නව සිනමාශාලා විවෘත කිරීම හා වසා දමා තිබූ සිනමාශාලා නැවත විවෘත කිරීම
- සිනමාශාලා පරීක්ෂා කිරීම
- විදේශ රූගත කිරීම් අධීක්ෂණය

**14.2 සිනමාශාලා ඉදිකිරීම සඳහා ඉඩම් ගොඩනැගිලි පිළිබඳ තොරතුරු රැස් කිරීම**

2016 වසර තුල සිනමාශාලා ඉදි කිරීම සම්බන්ධ තොරතුරු රැස් කිරීම හා ඉදිවෙමින් පවතින සිනමාශාලා

**ඉදිවෙමින් පවතින සිනමාශාලා**

- යාපනය දිස්ත්‍රික්කය - පේදුරුතුඩුව නව සිනමාශාලා සංකීර්ණය
- කිලිනොච්චිය නව සිනමාශාලා සංකීර්ණය
- මඩකලපුව ශාන්ති සිනමාශාලාව අසල ඉදිවන සිනමාශාලාව
- වෙන්කලඩි සෙල්වම් 2 සිනමාශාලාව
- රාජගිරිය නව සිනමාශාලාව
- කොල්ලුපිටිය සැක්සෝන් සිනමාශාලාව
- ගාල්ල සරසවි සිනමාශාලාව පිහිටි ස්ථානයේ ඉදිවන සිනමාශාලාව

**ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ තොරතුරු රැස් කිරීම**

පහත නගරවල සිනමාශාලා ඉදි කිරීමට යෝජිතව ඇත.

- මුන්දලම
- කොට්ටාව
- දෙනියාය
- ඌරුබොක්ක
- මාතර
- ගිරිඋල්ල
- හොරණ

**14.3 නව සිනමාශාලා විවෘත කිරීම හා වසා දමා තිබූ සිනමාශාලා නැවත විවෘත කිරීම.**

**විවෘත කරන ලද නව සිනමාශාලා**

- විස්ටා ලයිට් - ජා ඇල
- ස්කයි ලයිට් - මාලබේ
- විජයන්ති සිනමා 2 - කඩුවෙල

## 14.4 සිනමාශාලා පරීක්ෂා කිරීම

වසර තුළ සිනමාශාලා වාර 850 ක් පරීක්ෂා කර ඇත.

**සිනමාශාලා වල සිදුවන අක්‍රමිකතා සඳහා හරපත්‍ර නිකුත් කිරීම.**

පරීක්ෂණ නිලධාරින් විසින් සිනමාශාලා පරීක්ෂා කිරීමේ දි විවිධ අක්‍රමිකතා හඳුනාගෙන ඇත. ඒ සඳහා සංස්ථා චක්‍රලේඛ පරිදි කටයුතු කරමින් 2016 වර්ෂය සඳහා රු.1,284,760/- වටිනාකමකින් යුතු හරපත්‍ර 99 ක් නිකුත් කර ඇත. ඉන් රු.929,040/- ක මුදලක් අයකර ගෙන ඇත.

පෙර වර්ෂ වල නිකුත් කල හරපත්‍ර වලින් මෙම වසරේ අයකරගත් හරපත්‍ර 5 ක මුදල් රු.96,230/- කි.

## 14.5 විදේශ රූගත කිරීම් අධීක්ෂණය

විදේශ රටවලින් ශ්‍රී ලංකාවට පැමිණෙන වෙළඳ දැන්වීම් , චිත්‍රපට හා වාර්තාමය වැඩසටහන් රූගත කිරීම් අධීක්ෂණ කටයුතු සිදුකරන ලදි. ඒ අනුව, 2015 වසර තුල විදේශ රූගත කිරීම් 62 ක් අධීක්ෂණය කර ඇත

## 15. සුභසාධනය

සංස්ථා සුභසාධනය සකසුරුවම් හා ණයදීමේ සමිතියේ කටයුතු සමිතියේ සාමාජික සුභ සාධනය සඳහා මෙම වර්ෂය තුලද ක්‍රියාත්මක විය

## 16. ක්‍රීඩා සංගමය

වර්ෂය තුල පහත කටයුතු සහ ජයග්‍රහණ සංගමය විසින් ලබාගෙන ඇත.

- සංස්ථා කාර්යය මණ්ඩල සහභාගි කර ගනිමින් අවුරුදු උත්සවය පැවැත්වීම
- ජනසතු සේවා එල්ලේ කැරම් තරඟ මාලාවට ක්‍රිඩකයින් සහභාගි කරවීම
- ජනසතු සේවා එල්ලේ තරඟ මාලාවට සහභාගි වී, බී කොටසේ ශූරතාවය දිනා ගැනීම
- ඇසිදිසි ක්‍රිකට් තරඟාවලිය සඳහා ප්‍රථම වතාවට සංස්ථාව නියෝජනය කරමින් කාන්තා කණ්ඩායමක් ඉදිරිපත් කිරීම
- අභ්‍යන්තර කැරම් තරඟ මාලාවක් පවත්වා ක්‍රීඩකයින් ශ්‍රේණිගත කිරීමේ කටයුතු සිදු කිරීම.
- කැරම් ක්‍රීඩාවට අවශ්‍ය ඉත්තන් ස්ටයිගර් ස්ටූල් 12 ක් ලබා ගැනීම.

## 17. ආගමික කටයුතු

### 17.1 බෞද්ධ සංගමය

- සෑම වසරකම ජනවාරි 21 දිනට යෙදෙන සංස්ථාවේ සංවත්සර දින හා සිනමාවේ සංවත්සර දින නිමිති කරගෙන සර්ව රාත්‍රික පරිත්‍රාන ධර්ම දේශනාවක් පැවැත්වීම සහ පසුදින හීල් දානයක් පිරිනැමීම.

- වෙසක් උත්සවය නිමිති කරගෙන සංස්ථා පරිශ්‍රය පුරා වෙසක් සැරසිලි සිදු කිරීමසහ සංස්ථා සේවකයින් වෙනුවෙන් වටිනා ධර්ම ග්‍රන්ථයක් පිරිනැමීම.

- සෑම වසරකම වෙසක් උත්සවය නිමිති කරගෙන සංස්ථා පරිශ්‍රයේ සිදුකරනු ලබන කොපි දන්සැල අවලංගු කර එම කාල වකවානුවේ ඇති වු ගංවතුරෙන් ආපදාවට පත් වුවන් දහසකට ආසන්න පිරිසකට දිවා ආහාරය ලබාදීම.

- සංස්ථා සේවක මහත්ම මහත්මින්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් සඳහා අභ්‍යාස පොත් ලබා දීම.

### 17.2 ක්‍රිස්තියානි සංගමය

සංස්ථා කාර්ය මණ්ඩලයේ දූ දරුවන්ගේ සහභාගිත්වයෙන් වාර්ෂික නත්තල් උත්සවය පැවැත් වීම.

## 18. වෛද්‍ය සහනාධාර ක්‍රමය

සාමාජික මුදල් හා සංස්ථාවෙන් ප්‍රදානය කරනු ලබන මුදල් මත පවත්වාගෙන යනු ලබන වෛද්‍ය සහනාධාර ක්‍රමය මෙම වර්ෂය තුල ද ක්‍රියාත්මක වු අතර, එහි පාලන කමිටුව පහත පරිදි වේ.

එච්.ජී.යු. ජයලත් මයා - කමිටු සභාපති (වැ.බ.නි.සාමාන්‍යාධිකාරි - මුදල්)

නාමල් වීරබාහු මයා - කමිටු සාමාජික (පරිපාලන නිලධාරි-පාලන හා මානව සම්පත්)

ආර්.පී.තිස්ස මයා - කමිටු සාමාජික (ලේකම් - ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය)

කේ.ආර්.වින්සන් මයා - කමිටු සාමාජික (නියෝජිත - ජාතික සේවක සංගමය)

සුඛිත ඉලංගකෝන් මයා - කමිටු සාමාජික (සභාපති - චිත්‍රපට සංස්ථා සේවක සංගමය)

එච්.ඩී.අසංක ගුණතිලක මයා - කාර්යභාර නිලධාරි

## 19. වෘත්තිය සමිති

ජාතික සේවක සංගමය, ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය හා චිත්‍රපට සංස්ථා සේවක සංගමය මෙම වසර තුලදි ද පාලන අධිකාරිය සමඟ සහයෝගයෙන් කටයුතු කර ඇත.

## 20. විශේෂ ප්‍රණාමය

රේඛීය අමාත්‍යාංශය වෙනස් වීම හේතුවෙන් සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය ඉල්ලා අස්ව ඇති අතර, හිටපු සභාපති නීතිඥ දීපාල් චන්ද්‍රරත්න මහතා සංස්ථාවේ අභිවෘද්ධිය හා උන්නතිය වෙනුවෙන් පසුගිය කාලසීමාවේ කරන ලද මෙහෙය ඇගයීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

මෙම කාලසීමාව තුළ පහත ව්‍යාපෘතීන් ඒ මහතා විසින් ආරම්භ කර ඇත.

1. සිනමා පාසල පිහිටුවීම (Establishment of National Film Academy)
2. චිත්‍රපට සංරක්ෂණාගාරය සහ ප්‍රතිෂ්ඨාපන ඒකකයක් ස්ථාපිත කිරීම (Establishment of National Film Archives and Film Restoration Unit)

## 21. ස්තුතිය

2016 වසරේ සාර්ථක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සංස්ථා කාර්ය මණ්ඩලය ඉතා වගකීමෙන් හා අප්‍රතිහත ධෛර්යෙන් යුතුව සිය සේවාවන් ඉටු කර ඇත. එම සේවාවන් අධ්‍යක්ෂ මණ්ඩලය ඉමහත් සේ අගය කරන අතර ඔවුන් වෙත සිය ස්තුතිය කෘතවේදීව පලකර සිටියි.

සිතේන්ද්‍ර සේනාරත්න
සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

## 2016.12.31 දිනට අවසන් වර්ෂය සඳහා

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| විස්තරය | සටහන | 2016 | 2015 | 2016 ප්‍රදර්ශන | 2016 චිත්‍රාගාරය | 2016 නිෂ්පාදන | 2016 පොදු පරිපාලන වියදම් |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| විකුණුම් | 03 | 57,500,610 | 53,594,147 | 522,273 | 2,345,086 | - | 54,633,251 |
| අඩු කළා : විකුණුම් පිරිවැය | 04 | 2,763,999 | 2,866,206 | - | (186,852) | - | (2,577,147) |
| දළ ලාභය | | 54,736,611 | 50,727,941 | 522,273 | 2,158,234 | - | 52,056,104 |
| අඩු කළා : වියදම් | | | | | | | |
| සේවක පාරිශ්‍රමික | 05 | 80,053,840 | 77,611,315 | 11,950,044 | 10,799,678 | 9,639,357 | 47,664,761 |
| ගමන් හා යැපීම් දීමනා | 06 | 1,658,035 | 429,651 | - | 12,140 | 3,705 | 1,642,190 |
| සැපයුම් හා උපකරණ | 07 | 7,376,420 | 6,145,388 | - | 1,469,344 | - | 5,907,076 |
| අළුත්වැඩියා කිරීම් නඩත්තු හා ක්ෂයවීම් | 08 | 29,662,545 | 28,406,798 | - | 5,948,866 | - | 23,713,679 |
| ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | 09 | 17,309,406 | 14,386,447 | 339,627 | 1,425,073 | 274,045 | 15,270,661 |
| බොල් ණය සඳහා හානිකරන ගැලපීම් | | 2,809,819 | 10,995,465 | - | - | - | 2,809,819 |
| පාරිතෝෂික වෙන් කිරීම් | | 7,131,335 | 20,485,019 | 1,287,564 | 905,434 | 272,063 | 4,666,274 |
| චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල් සඳහා වෙන් කිරීම් | | 500,000 | 200,000 | - | - | 500,000 | - |
| ජාතික චිත්‍රපට උත්සව සඳහා වෙන් කිරීම | | 5,000,000 | | - | - | 5,000,000 | - |
| තොග හානි | | - | - | - | - | - | - |
| | | 151,501,400 | 158,660,083 | 13,577,235 | 20,560,535 | 15,689,170 | 101,674,460 |
| පොදු පරිපාලන වියදම් අන්තර්ග්‍රහණය කිරීම් | | - | - | 15,177,463 | 13,716,411 | 12,242,715 | (41,136,589) |
| | | 151,501,400 | 158,660,083 | 28,754,698 | 34,276,946 | 27,931,885 | 60,537,871 |
| මෙහෙයුම් ලාභය / අලාභය | | (96,764,789) | (107,932,142) | **(28,232,425)** | **(32,118,712)** | **(27,931,885)** | **(8,481,767)** |
| එකතු කළා : වෙනත් ආදායම් | 10 | 62,125,983 | 48,745,417 | | | | |
| වසරේ ලාභය /අලාභය | | (34,638,806) | (59,186,725) | | | | |
| එකතු කළා : භාණ්ඩාගාර ලැබීම් | | 74,250,000 | 80,000,000 | | | | |
| බදු පෙර ලාභය | | 39,611,194 | 20,813,275 | | | | |
| අඩු කළා : බදු සඳහා වෙන් කිරීම් | | - | - | | | | |
| ඌනතාවය / අතිරික්තය | | **39,611,194** | **20,813,275** | | | | |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2016 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | සටහන | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| **නියෝජනය වන්නේ** | | | |
| **ස්ථාවර වත්කම්** | | | |
| දේපල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 11 | 348,504,036 | 356,557,037 |
| දිගු කාලීන ආයෝජන | 12 | 127,000 | 127,000 |
| | | 348,631,036 | 356,684,037 |
| **ජංගම වත්කම්** | | | |
| කෙටි කාලීන ආයෝජන | 13 | 283,799,769 | 207,087,271 |
| තොග | 14 | 6,373,332 | 9,329,064 |
| ණයගැතියෝ | 15 | 182,390,282 | 140,875,826 |
| විවිධ ණයගැතියෝ | 16 | 171,981,587 | 159,015,837 |
| තැන්පතු හා ඉදිරි ගෙවීම් | 17 | 5,171,821 | 3,357,237 |
| මුදල් හා බැංකු ශේෂය | 18 | 36,731,083 | 67,844,504 |
| | | 686,447,874 | 587,509,739 |
| මුළු වත්කම් | | **1,035,078,910** | **944,193,776** |
| **යෙදවූ ප්‍රාග්ධනය** | | | |
| අනුදත් ප්‍රාග්ධනය | | 10,000,000 | 10,000,000 |
| සමුච්චිත ලාභය | | 389,424,993 | 334,063,659 |
| වෙනත් සංචිත | | 123,482,759 | 123,482,759 |
| | | 522,907,752 | 467,546,418 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ප්‍රදානයන් | 19 | 146,322,543 | 146,944,856 |
| පාරිතෝෂික වෙන් කිරීම් | 20 | 35,932,903 | 49,392,704 |
| | | 182,255,446 | 196,337,560 |
| **එකතු කළා : ජංගම වගකීම්** | | | |
| තැන්පතු | 21 | 2,544,227 | 2,474,227 |
| චිත්‍රපට කුලී ණයහිමියෝ | 22 | 275,556,800 | 242,661,692 |
| වෙනත් ණයහිමියෝ | 23 | 51,814,685 | 35,173,879 |
| | | 329,915,712 | 280,309,798 |
| මුළු වගකීම් | | **1,035,078,910** | **944,193,776** |

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව සකස් කර ඇත.

| | | |
|---|---|---|
| …………………… | ……………… | ……………… |
| වැ. බ. නි. සාමාන්‍යාධිකාරී - මුදල් | සභාපති | අධ්‍යක්ෂ |

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව ,
303 , බෞද්ධාලෝක මාවත ,
කොළඹ 07.

2017.02.23

# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | හිමිකම් ප්‍රාග්ධනය | සමුච්චිත ලාභය | ප්‍රාග්ධන සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | වෙනත් සංචිත | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **2015.01.01 දිනට ශේෂය** | 10,000,000 | 334,063,659 | 499,898 | 115,153,399 | 7,829,462 | 467,546,418 |
| වසරේ ලාභය | - | 15,750,140 | - | - | - | 15,750,140 |
| **2015.12.31 දිනට ශේෂය** | 10,000,000 | 349,813,799 | 499,898 | 115,153,399 | 7,829,462 | 483,296,558 |
| වසරේ ලාභය | - | 39,611,194 | - | - | - | 39,611,194 |
| **2016.12.31 දිනට ශේෂය** | **10,000,000** | **389,424,993** | **499,898** | **115,153,399** | **7,829,462** | **522,907,752** |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

**2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2016 | 2015 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල්** | රු. | රු. |
| බදු අඩු කිරීමට පෙර ශුද්ධ ලාභය | (34,638,806) | (59,186,725) |
| (අඩු කළා ) | | |
| නිෂ්පාදන ණය මත පොළිය | (1,048,738) | (396,064) |
| ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොළිය | (19,790,921) | (11,111,070) |
| | (55,478,465) | (70,693,859) |
| **මුදල් චලනය කෙරෙහි බල නොපාන විෂයයන් සඳහා ගැලපීම** | | |
| ක්ෂයවීම් | 22,068,858 | 21,160,625 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 7,131,335 | 20,485,019 |
| පාරිතෝෂික අධි වෙන් කිරීම (2015) | (16,830,608) | |
| නිෂ්පාදන ණය පොලී ඌන වෙන් කිරීම් | 519,102 | |
| අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන | 2,809,819 | 10,995,465 |
| රාජ්‍ය ප්‍රදානයන් ආදායමට හඳුනා ගැනීම | (20,622,313) | (19,917,957) |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීමේ අලාභය | 46,875 | - |
| | (60,355,397) | (37,970,707) |
| **ඉකුත් කාල පරිච්ඡේද වල විෂයයන්** | | |
| ඉකුත් කාල පරිච්ඡේද වල විෂයයන් සඳහා ගැලපීම | 15,750,140 | (1,479,671) |
| කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්කම් වලට පෙර  මෙහෙයුම් ලාභය | (44,605,257) | (39,450,378) |
| **කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්වීම්** | | |
| තොගය ( අඩුවීම) | 2,955,732 | 2,580,347 |
| ණයගැතියෝ ( වැඩිවීම) | (57,290,025) | (38,278,601) |
| තැන්පතු හා ඉදිරි ගෙවීම් ( වැඩිවීම) | (1,814,584) | 7,453,516 |
| තැන්පතු  ( වැඩිවීම ) | 70,000 | (10,000) |
| ණයහිමියෝ (වැඩිවීම) | 32,895,108 | 34,050,893 |
| වෙනත් ණයහිමියෝ ( වැඩිවීම ) | 16,121,704 | (1,710,483) |
| | (51,667,322) | (35,364,706) |
| **අඩු කළා :** | | |
| පාරිතෝෂික ගෙවීම් | (3,760,528) | (5,153,128) |
| | (55,427,850) | (40,517,834) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| නිෂ්පාදන ණය පොලී | 1,048,738 | 396,064 |
| ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොළිය | 19,790,921 | 11,111,070 |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | (14,077,732) | (8,915,851) |
| භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු ආයෝජනය | (76,712,498) | (25,807,906) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබූ මුදල් | 15,000 | - |
| භාණ්ඩාගාර ලැබීම් | 94,250,000 | 110,000,000 |
| මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශුද්ධ වැඩිවීම් | (31,113,421) | 46,265,543 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය | 67,844,504 | 21,578,961 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය | **36,731,083** | **67,844,504** |

**මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම පිළිබඳ ප්‍රකාශය**

සංස්ථාවේ කළමනාකරණය ,

1. සංස්ථාවේ ආදායම සහ වියදම වත්කම් සහ වගකීම් සහ අනෙකුත් සියළු මූල්‍ය ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීම පිළිබඳව ,

2. සංස්ථාවේ මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මූල්‍ය තත්ත්වය පිළිබද සත්‍ය හා සාධාරණ ඉදිරිපත් කිරීමක් සඳහා , 1995 අංක.15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් සකස් කිරීම පිළිබදව හා

3. සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීමට හා වංචා සහ විෂමතා වැලැක්වීම සඳහා උචිත පියවර ගැනීම පිළිබදව වගකිව යුතු වන්නේය.

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය**

---

## 1. පොදු තොරතුරු

### 1.1.1 පිහිටීම හා නීතිමය තත්ත්වය

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව 1971 අංක.47 දරන පනත යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කොට පිහිටුවන ලදී. එහි ලියාපදිංචි කාර්යාලය , කොළඹ 07 , බෞද්ධාලෝක මාවතේ අංක.303 දරන ස්ථානයෙහි පිහිටියේය.

### 1.1.2මූලික ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වරූපය

ශ්‍රී ලංකා චිත්‍රපට සංස්ථාව මූලිකවම ශ්‍රී ලංකාවේ චිත්‍රපට කර්මාන්තය ජගත් ප්‍රමිතීන්ට සමපාත වන සේ වර්ධනය කිරීමෙහිලා නිරතව සිටී.

### 1.1.3 නිකුත් කිරීම සඳහා අනුමත කළ දිනය

මෙම මූල්‍ය ප්‍රකාශනයන් බෙදා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017.02.27දින අනුමැතිය දෙන ලදී.

### 1.2ගිණුම් පිළියෙල කිරීමේ පදනම

### 1.2.1අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය

සංස්ථාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය , විස්තීර්ණ ආදායම , හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය , වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය සහිත සටහන් ( මූල්‍ය ප්‍රකාශන ) සකස් කරන ලද්දේ , ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය මගින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) නියෝජනය වන පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS) වලට අනුකූල වන පරිද්දෙනි.

**1.2.2මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම**

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ කළමනාකරීත්වය විසින් දරනු ලැබේ.

**1.2.3ගිණුම්කරණ පදනම**

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් උචිත හෙළිදරව් කිරීමක් කර ඇත්නම් මිස මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම් කොට සකස් කර ඇත.

**1.2.4අඛණ්ඩතාව**

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී කළමනාකරණය විසින් සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තක්සේරු කර ඇත. සංස්ථාව , එහි මෙහෙයුම් පෙනෙන අනාගත කාලය තුළදී පවත්වාගෙන යාමට අවශ්‍ය තරම් සම්පත් තිබෙන බව විශ්වාසනීයව අපේක්ෂා කරයි. තිබෙන්නා වූ සියලු තොරතුරු සැලකිල්ලට ගත් විට ඉදිරියේදී සංස්ථාව ඈවර කිරීමට හෝ එහි මෙහෙයුම් නතර කිරීමට හේතුවක් නොපෙනෙන අතර , අඛණ්ඩව පවත්නා ආයතනයක් සේ සලකා මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

**1.2.5ක්‍රියාත්මක වීමේ හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්**

සංස්ථාවේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

**1.2.6වැදගත් වන ගිණුම්කරණ විනිශ්චයන් , ඇස්තමේන්තු සහ උපලේඛන**

වාර්තා කරන දිනයේදී වාර්තා කරන ලද ආදායම් , වියදම් , වත්කම් සහ බැරකම් සහ අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීම පිළිබඳව වාර්තා කරන ලද සංඛ්‍යාවන්ට බලපාන විනිශ්චයන් , ඇස්තමේන්තු හා උපකල්පනයන් කිරීමට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණයට අවශ්‍ය වේ. කෙසේ වුවද , මෙම උපකල්පනයන්ගේ හා ඇස්තමේන්තු වල තිබෙන්නා වූ අවිනිශ්චිතභාවය හේතුවෙන් අනාගතයේදී වත්කම් හා බැරකම් වල පවත්නා

වටිනාකම් වල සැලකිය යුතු ගැලපීම් කිරීමට අවශ්‍ය වන්නා වූ බලපෑම් ඇතිවිය හැකිය. මෙම කාරණයන්හි විනිශ්චයන් , ඇස්තමේන්තු හා උපකල්පනයන් ඇතුළත් විය හැකිය.

**<u>ඇස්තමේන්තු සහ උපකල්පන</u>**

ඉදිරි මූල්‍ය වර්ෂයේදී වත්කම් හා බැරකම් වල පවත්නා වටිනාකම්හි සැලකිය යුතු ගැලපීම් කිරීමට සිදු වන්නා වූ , විශේෂිත අවදානම් ඇතිවිය හැකි , වාර්තා කරන දිනට පැවති අනාගතය පිළිබඳ ප්‍රධාන උපකල්පනයන් හා ඇස්තමේන්තු මූලාශ්‍රයන් පහත දක්වා ඇත.

**(අ)<u>මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගය</u>**

ශේෂ පත්‍රයෙහි වාර්තා කරන ලද මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වල සාධාරණ අගය ක්‍රියාකාරී වෙළෙඳ පොලේ ව්‍යුත්පන්න විය නොහැකි අතර , ඒවා වට්ටම් කළ මූල්‍ය ප්‍රවාහනයන් සහ / හෝ ගණිතමය ආකෘති ඇතුළු ශිල්ප ක්‍රම භාවිතා කරමින් නිශ්චය කර ඇත. මෙම ආකෘති වල යෙදවුම් , හැකි අවස්ථාවන්හිදී නිරීක්ෂණය කළ හැකි වෙළෙඳ පොල දත්තයන්ද එවැනි දෑ නොමැති විට විනිශ්චය කිරීමෙන්ම ලබා ගන්නා ලදී.

මෙම සාධකයන් පිළිබඳ උපකල්පනයන්හි වෙනස්වීම් වාර්තා කර ඇති මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගය කෙරෙහි බලපෑ හැකිය.

**(ආ)<u>සාධාරණ අගය</u>**

සාධාරණ අගය යනු දැනුමක් හා කැමැත්තක් ඇති පාර්ශව අතර අතේ දුරින් සිදූ වූ ගණුදෙනුවකදී වත්කමක් හුවමාරු කළ හැකි අගයයි. මූල්‍ය සාධන පත්‍රයක් මුලින්ම හඳුනා ගැනීමේදී එහි සාධාරණ අගය ලෙස සාමාන්‍යයෙන් ගැනෙන්නේ ලැබූ හෝ ගෙවූ වටිනාකමයි. පසුකාලීනව මූල්‍ය වත්කමක සාධාරණ අගය වන්නේ සක්‍රීය වෙළඳපොලක ඉල්ලුම් කෙරෙන ලංසු තබන මිළයි. මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් ඉල්ලුම් කරන මිළයි. මුදල් හා සමාන දෑ සහ කෙටි කාලීන ආයෝජන සඳහා පවත්නා අගය වන්නේ සාධාරණ මිළයි.

## 2.විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1වත්කම් සහ ඒවා ඇගයීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති මුදල් හා බැංකු ශේෂයන් සහ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී හෝ වර්ෂයක් තුළ හෝ යන දෙකින් අඩු කාල සීමාවේදී මුදල් බවට උපලබ්ධි වන ඒවාය.

### 2.2මූල්‍ය සාධන පත්‍ර

### 2.2.1මූල්‍ය වත්කම් ( ව්‍යුත්පන්න නොවන )

මූල්‍ය වත්කම් පහත සඳහන් කොටස් වලට වර්ගීකරණය කෙරේ. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට අගය කළ දෑ , ණය සහ ලැබිය යුතු දෑ , කල් පිරෙන තුරු හෝ විකිණීමට තිබෙන දෑ , මෙම වර්ගීකරණය කළමනාකරණය විසින් නිර්ණය කරන ලද්දේ මූලික හඳුනා ගැනීම හා එම ආයෝජන අත්පත් කර ගැනීමේ අරමුණ පදනම් කොට ගෙනය.

### 2.2.2වර්ගීකරණය , හඳුනා ගැනීම සහ මැනීම.

කළමනාකරණය විසින් එහි මූල්‍ය වත්කම් පහත සඳහන් ලෙස වර්ගීකරණය කරයි.

අ. ණය සහ ලැබිය යුතු දෑ

ආ. විකිණීම සඳහා ඇති දෑ

**අ. ණය සහ ලැබිය යුතු දෑ**

ස්ථාවර හෝ සක්‍රීය වෙළෙඳපොලේ මිළ ප්‍රකාශ නොවන , තීරණය වූ ගෙවීම් සහිත මූල්‍ය වත්කම්ය. මෙම වත්කම් මුලින්ම සාධාරණ වටිනාකමට එකතු වූ ඍජුවම අදාල වන ගණුදෙනු පිරිවැය හඳුනා ගනු ලැබේ. පසුකාලීනව ණය සහ ලැබිය යුතු දෑ සඵල පොලී ක්‍රමය මත ක්‍රමක්ෂය කිරීමත් , යම් හානිකරණ පාඩුවක් වේනම් එයත් සැලකිල්ලට ගෙන මනිනු ලැබේ.

**ආ. විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්**

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු නිශ්චිත නොවූ කාල පරිච්ඡේදයක් තබා ගැනීමට අදහස් කරන , ද්‍රවශීලතා හේතු හෝ පොලී අනුපාත වෙනස්වීම මත , විනිමය අනුපාත වෙනස්වීම මත හෝ ස්කන්ධ මිළ මත විකිණීමට අවශ්‍ය විය හැකි හෝ ණය සහ ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර නොමැති කල් පිරෙන තුරු තබා ගන්නා හෝ ලාභ හෝ අලාභ මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම්ය.

**2.2.3<u>සාධාරණ අගය නිශ්චය කිරීම.</u>**

ණය සහ අත්තිකාරම් මෙන්ම වගකීම් වල සාධාරණ අගය තීරණය කිරීමේදී වර්තමාන අගය ආකෘතිය එකඟ වූ මුදල් ප්‍රවාහයන් පදනම් කොට ගෙන ණයෙහි ගුණාත්මකභාවයද , ද්‍රවශීලතාව හා පිරිවැයද සැලකිල්ලට ගෙන නිර්ණය කෙරේ. වෙළෙඳ ලැබිය යුතු හා ගෙවිය යුතු අයිතම වල ආසන්න සාධාරණ අගය ලෙස සැලකෙන්නේ පවත්නා වටිනාකමින් හානිකරණය සඳහා අඩු කළ පසු ඉතිරියයි.

**2.2.4<u>ප්‍රති වර්ගීකරණය</u>**

ණය හා ලැබිය යුතු දැහැර මූල්‍ය වත්කම් , වෙලදාම සඳහා අයිතමයන්ගෙන් වෙන් කොට වර්ගීකරණය කිරීමට ඉතා කලාතුරකින් ඇතිවිය හැකි පරිසරයකදී හුදෙකලා සිදුවීමක් ලෙස අවසර දෙනු ලැබේ. ණය සහ ලැබිය යුතු දෑ අතරින් වෙලදාම සඳහා වූ දේ ලෙස ප්‍රති වර්ගීකරණය කිරීම සංස්ථාව විසින් ණය සහ ලැබිය යුතු දෑ යන නිර්වචනයට අදාළ වන්නේනම් ප්‍රතිවර්ගීකරණය තොරා ගනු ඇත.

ප්‍රතිවර්ගීකරණය කරනු ලබන්නේ එසේ කරන දිනට ඇති සාධාරණ අගයටයි. සාධාරණ අගය වන්නේ නව පිරිවැය හෝ ක්‍රමක්ෂය පිරිවැය මතය.

## 2.2.5<u>හානිකරණය</u>

### (අ)<u>ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යන මූල්‍ය වත්කම්</u>

එක් එක් වාර්තාකරණ දිනයේදී මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අගය අඩු වී ඇති බවට වන සාක්ෂි සංස්ථාව විසින් අගය කෙරේ. වත්කමෙහි ආරම්භක හඳුනා ගැනීමෙන් පසු ඇති වූ අවස්ථා එකක හෝ කිහිපයක ප්‍රතිඵලයක් ලෙස ( දරන ලද අලාභ අවස්ථා ) අගය අඩුවීමක පරමාර්ථ සාක්ෂියක් තිබේනම් සහ එම අලාභ අවස්ථාවට මූල්‍ය වත්කම් වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ හෝ විශ්වාසවන්ත ලෙස ඇස්තමේන්තුගත කළ හැකි මූල්‍ය වත්කම් කාණ්ඩයක් මත බලපෑමක් ඇත්නම් පමණක් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අගය අඩු වූ බවට සලකනු ලැබේ. අගය අඩුවන බවට වන සාක්ෂි ලෙස , ණයකරුවෙකු හෝ ණයකරුවන් කාණ්ඩයක් සැලකිය යුතු මූල්‍ය දූෂ්කරතා වලට මුහුණ දෙමින් සිටින බව පෙන්වීම , පොළියෙහි හෝ මුලධන ගෙවීම් වල පැහැර හැරීම් , ඔවුන් බංකොළොත්භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයට පත්වීමට ඇති හැකියාව සහ පැහැර හැරීම් සමග සහසම්බන්ධිත ආර්ථික තත්ත්ව හෝ හිඟ මුදල් වල වෙනස්වීම් වැනි ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහ වල ඇගයිය හැකි අඩුවීමක් නිරීක්ෂණය කළ හැකි දත්ත මින් පෙන්වීම , ඇතුළත් විය හැකි වේ.

ක්‍රමක්ෂිත පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම් සඳහා , තනි තනි වශයෙන් වැදගත් වන මූල්‍ය වත්කම් සඳහා තනි තනි වශයෙන් අගය අඩුවීම්හි පරමාර්ථ සාක්ෂි තිබේදැයි සංස්ථාව විසින් පළමුවෙන් තනි තනි වශයෙන් අඟයන අතර , තනි තනි වශයෙන් වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහා සාමූහිකව අඟයයි. වැදගත් වුවත් , නොවුවත් තනි තනි වශයෙන් අඟයනු ලැබූ මූල්‍ය වත්කමක අඟය අඩුවීම පිළිබඳ පරමාර්ථසාක්ෂියක් නොමැති බව සමූහය විසින් නිශ්චය කළහොත් එය , එම වත්කම සමාන බැර අවදානම් ලක්ෂණ සහිත වත්කම් කාණ්ඩයක ඇතුළත් කරන අතර ඒවා අඟය අඩුවීම සඳහා සාමූහිකව අඟයනු ලැබේ.

අඟය අඩුවීම සඳහා තනි තනි වශයෙන් අඟයනු ලැබූ සහ අඟය අඩුවීමක් සහිත හෝ දිගින් දිගටම හඳුනා ගැනීමට නියමිත වත්කම් අගය අඩුවීමෙහි සාමූහික ඇඟයීමට ඇතුළත් කරනු නොලැබේ.

ක්‍රමක්ෂිත පිරිවැයට ගෙන ආ වත්කම් මත අගය අඩුවීමේ අලාභදරා ඇති බවට පරමාර්ථ සාක්ෂියක් ඇති විට , වත්කමෙහි පවතින වටිනාකම සහ මූල්‍ය වත්කමෙහි මුල් ඵලදායි පොළි අනුපාතිකයට වට්ටම්ගත අනාගත මූල්‍ය ප්‍රවාහ වල වර්තමාන වටිනාකම ( නොදරන ලද අනපේක්ෂිත අනාගත ණය අලාභ හැර ) අතර වෙනසින් අලාභයෙහි ප්‍රමාණය අගයනු ලැබේ. ණයක් සඳහා වෙනස් වන පොළි අනුපාතියක් පවතීනම් . යම් අගය අඩුවීමේ අලාභයක් ඇගයීම සඳහා වට්ටම්ගත අනුපාතය වන්නේ වර්තමාන ඵලදායි පොලී අනුපාතයයි. වත්කමෙහි පවතින වටිනාකම දීමනා ගිණුමක් භාවිතා කිරීම හරහා අඩු වන අතර , හානිවන ප්‍රමාණය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. පොලී ආදායම . අඩු වූ පවතින වටිනාකම මත එක්රැස් වීම පවත්වා ගෙන යනු ලබන අතර එය අගය අඩු වීමේ අලාභ ඇගයීමේ කාර්යය සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම්ගත කළ පොලී අනුපාතය භාවිතා කරමින් එක් රැස් කරනු ලැබේ. ආදායම් ප්‍රකාශනයෙහි ආයෝජන ආදායම් වල කොටසක් ලෙස පොලී ආදායම වාර්තා කරනු ලැබේ.අනාගත අය කර ගැනීමෙහි තාත්වික අපේක්ෂාවන්ක නොමැති විට ආශ්‍රිත දීමනා සමගින් ණය කපා හරිනු ලබන අතර , සියලු සුරකුම් සමුහයට උපලබ්ධි කර හෝ පවරාගෙන ඇත. ආසන්න වර්ෂයකදී අගය අඩුවීම හඳුනා ගැනීමෙන් පසු යම් හේතුවක් නිසා ඇස්තමේන්තුගත අගය අඩුවීමේ අලාභය වැඩි වේ නම් හෝ අඩු වේනම් දීමනා ප්‍රමාණය සීරුමාරු කර පෙර හඳුනා ගනු ලැබු අගය අඩුවීමේ අලාභය වැඩි හෝ අඩු කරනු ලැබේ. අනාගත කපා හැරීමක් පසුව අය කර ගතහොත් එම අය කිරීම ආදායම් ප්‍රකාශනයෙහි දීමනා (Allowance) ගිණුමට ගලපනු ලැබේ.

**(ආ) අනෙකුත් මූල්‍යමය නොවන වත්කම් හානිකරණය**

**ව**ත්කමක පවත්නා අගය අය කර ගත නොහැකි බව පෙනෙන පරිසරයකදී හානිකරණය සඳහා විමසා බැලීමට යටත් වේ. පවතින වටිනාකමඑහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි වටිනාකම ඉක්මවා යන්නේනම් අගය අඩුවීමක අලාභයක් හඳුනා ගනු ලැබේ. වත්කමක අය කර ගත හැකි වටිනාකම වන්නේ එහි භාවිතා කරනු ලබන වටිනාකම සහ එහි සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන වටිනාකම යන ඒවායින් ඉහළ අගය වේ.

**2.2.6හඳුනා ගැනීම අත් හැරීම.**

මූල්‍ය වත්කමක් ( හෝ කොටසක් හෝ සමූහයක කොටසක් ඇතුලුව ) හඳුනා ගැනීම අත් හරින අවස්ථා මෙසේය.

- මූල්‍ය ප්‍රවාහයන් ලැබීමේ අයිතිය ඉකුත් වීම.
- සංස්ථාව විසින් වත්කම මඟින් මුදල් ප්‍රවාහයන් ලැබීමේ අයිතිය පැවරීම හෝ ලැබුණු මුදල් ප්‍රවාහයන් තුන්වන පාර්ශවයකට පවරා දිය යුතු යැයි උපකල්පනය කිරීම.

(අ)සංස්ථාව විසින් සියලු ප්‍රතිලාභ හා අවදානම් පවරා දීම.
(ආ) සංස්ථාව විසින් සියලු ප්‍රතිලාභ හා අවදානම් පවරා දීමක් හෝ රඳවා ගැනීමක් නොකොට පාලන අයිතිය පැවරීම.

**2.2.7**නීතිමය අයිතියක් ඇති අවස්ථා වල මූල්‍ය වත්කම් හා වගකීම් සමාහරණය කොට ශුද්ධ අගය දක්වා ඇත.

**2.3.<u>දේපළ , යන්ත්‍ර හා උපකරණ</u>**

**2.3.1<u>හඳුනා ගැනීම හා මැනීම.</u>**

දේපළ , යන්ත්‍ර හා උපකරණ අයිතමයන් ඒවායේ සමුච්චිත ක්ෂය සහ හානිකරණ අලාභ අඩු කිරීමෙන් පසු පිරිවැයට හෝ තක්සේරු අගයට පෙන්වා ඇත. පිරිවැය තුළවත්කම අත් කර ගැනීමේදී දැරූ වියදම් වලින් ඍජුවම අදාල වන වියදම් ඇතුලත් වේ. ස්වයං නිර්මිත වත්කම් වල එම වත්කම් භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දැරූ ද්‍රව්‍යය පිරිවැය , ඍජු ශ්‍රමය , ඍජුවම බලපාන වෙනත් අදාල වියදම් ඇතුළත් වේ. අළුත්වැඩියා හා ඉදිරි අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ වෙනුවෙන් දරන ලද වියදම් ඒවා දරන අවස්ථාවේ වියදම් ලෙස හඳුනාගෙන ඇත.

**2.3.2<u>පසුකාලීන පිරිවැය</u>**

උපාංග ප්‍රතිපූර්ණය සඳහා දරන ලද වියදම වෙන් වෙන්ව එනම් පුළුල් පරීක්ෂාවන් හා පූර්ණ අළුත්වැඩියා වියදම් ප්‍රාග්ධනගත කෙරෙන්නේ ඒවායේ ආර්ථික ප්‍රතිලාභ ලැබීමට හේතු වන්නේනම් හා එම ප්‍රතිලාභ විශ්වාසදායකව මැනිය හැකි නම්ය. දෛනික සේවා කිරීම් ඒවා දරන අවස්ථාවේදී ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

**2.3.3ක්ෂය වීම්**

ක්ෂය සඳහා වෙන් කිරීම සරල මාර්ගක්‍රමය අනුව පිරිවැය/තක්සේරු අගය මත ගණනය කෙරේ. ඉඩම් හැර දේපළ , යන්ත්‍ර හා උපකරණ පහත දැක්වෙන ප්‍රතිශත අනුව ප්‍රයෝජනවත් ආයු කාලය තුළදී ශේෂය ගණනය කෙරේ.

| | | | |
|---|---|---|---|
| ගොඩනැගිලි | - | ප්‍රධාන කාර්යාලය | 2.5% |
| | - | ශ්‍රවණාගාරය | 5% |
| චිත්‍රපට සංකීර්ණය | - | ගොඩනැගිලි | 5% |
| | - | අනෙකුත් යන්ත්‍ර සූත්‍ර | 10% |
| ලී බඩු සවි කිරීම් | | | 25% |
| මෝටර් රථ | | | 25% |
| චිත්‍රපට සංරක්ෂණාගාරය | | | 10% |
| සංස්කෘතික / අධ්‍යාපනික / චිත්‍රපට උපකරණ | | | 10% |
| චිත්‍රපට උපකරණ | | | 10% |
| සුභසාධන උපකරණ | | | 10% |

දේපළ පිරියත හා උපකරණ මිළදී ගත් දිනෙන් ආරම්භව ක්ෂය කරනු ලැබේ.

**2.3.4හඳුනා ගැනීම ඉවත් කිරීම.**

දේපළ , පිරියත සහ උපකරණ අයිතමයක පවතින වටිනාකම අපහරණයකදී හෝ ඒවායින් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා ගැනීම නතර වේ. දේපළ , පිරියත හා උපකරණ අයිතමයක් හඳුනා නොගැනීමෙන් ඇතිවන ලාභය හෝ අලාභය අයිතමය හඳුනා නොගන්නා විට අදායම් ප්‍රකාශනයෙහි ඇතුලත් කරනු ලැබේ.

**2.3.5ස්පෘශ්‍ය වත්කම් හානිකරණය**

මූල්‍ය නොවන වත්කම් වල අගය අඩුවීමක කිසියම් ඇඟවීමක් තිබේදැයි නිශ්චය කිරීම සඳහා විලම්භිත බදු වත්කම් හාර සමූහයෙහි මූල්‍යමය නොවන වත්කම් වල පවතින වටිනාකම් ඒ ඒ වාර්තාකරණ දිනට සමාලෝචනය කරනු ලැබේ. එවැනි තත්ත්වයක් ඇත්නම් , එවිට වත්කමෙහි අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. අවිනිශ්චිත ඵලදායි ආයු කාලයක් සහිත හෝ මේ වන තෙක් භාවිතය සඳහා නොපවතින අස්පෘශ්‍ය වත්කම් සඳහා අය

කර ගත හැකි වටිනාකම එක් එක් වර්ෂයේදී එම අවස්ථාවේදීම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක හෝ මූල්‍ය උත්පාදක ඒකකයක පවතින වටිනාකම එහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි වටිනාකම ඉක්මවා යන්නේනම් අගය අඩුවීමක අලාභයක් හඳුනා ගනු ලැබේ. වත්කමක හෝ මූල්‍ය උත්පාදක ඒකකයක අය කර ගත හැකි වටිනාකම වන්නේ එහි භාවිතා කරනු ලබන වටිනාකම සහ එහි සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන වටිනාකම යන ඒවායින් ඉහළ අගය වේ. භාවිතයේ ඇති වටිනාකම (Value in use ) ඇගයීමේදී , මුදලෙහි කාලීන අගයෙහි වර්තමාන වෙළෙඳපොල ඇගයීම පිළිබිඹු කරනු ලබන බදු පෙර වට්ටම් අනුපාතයක් සහ වත්කමට හෝ මූල්‍ය උත්පාදක ඒකකයට විශේෂිත අවදානම් භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලැබේ.

අගය අඩුවීම පරීක්ෂා කිරීමේ අරමුණ සඳහා තනි තනිව පරීක්ෂා කළ නොහැකි වත්කම් වෙනත් වත්කම් වලින් මුදල් ගැලීමෙන් විශාල වශයෙන් නිදහස් වන නොකඩවා පාවිච්චියෙන් මුදල් ගැලීම උත්පාදනය කරනු ලබන කුඩාම වත්කම් කාණ්ඩයකට කාණ්ඩගත කරනු ලැබේ. අගය අඩුවීමේ අලාභ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

**2.4<u>තොග</u>**

සියළු තොග පිරිවැය හෝ ශුද්ධ ප්‍රත්‍යාගණන අගය යන දෙකින් අවමයට අගය කෙරේ. පිරිවැය පළමු ඇතුළු - පළමු පිට (FIFO) ක්‍රමය පදනම් කොටගෙන තීරණය කෙරේ.

**2.5<u>ආදායම් බදු</u>**

සංස්ථා සේවකයන්ගේ පඩි හා අනෙකුත් දීමනාද , වියදම් වලින් කොටසක් පියවීම සඳහාද , භාණ්ඩාගාරයෙන් මුදල් ලබා දෙනු ලැබේ. භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් සඳහා බදු නොගෙවිය යුතුය යන පදනම මත බදු ගෙවීම සඳහා වෙන් කිරීමක් කර නොමැත.

සංස්ථාව විසින් වාර්ෂිකව ලැබූ ලාභය ආදායම් බදු ගෙවීමෙන් පසු ඇති වූ අතිරික්තයෙන් 24% ක ප්‍රමාණයක් ලාභය වෙනුවෙන් බදු ගෙවිය යුතුය යන්න අපගේ මතය වන අතර , එම ප්‍රමාණය විය යුත්තේ ආදායම් බදු සඳහා සිදු කළ ගැලපුම් කටයුතු වලින් පසු ඉතිරි ශුද්ධ ලාභය යන්න අපගේ විශ්වාසයයි.

**2.6අනෙකුත් වත්කම්**

අනෙකුත් වත්කම් වල අනෙකුත් ණයගැතියන් සහ ලැබිය යුතු දෑ , අත්තිකාරම් , තැන්පතු , කලින් ගෙවීම් , ලැබිය යුතු බදු ඇතුළත් වේ.

**(අ)අත්තිකාරම් , තැන්පතු , කලින් ගෙවූ වියදම්**

එක් මුදල් වර්ෂයකට වඩා වැඩි කාලයක් සඳහා ප්‍රතිලාභ ලැබෙතැයි පෙනෙන යම් සම්බන්ධතාවයක්ඇති වියදම් අත්තිකාරම් , තැන්පතු හා කලින් ගෙවූ වියදම් ලෙස වර්ගීකරණය කරන ලදී. එවැනි වියදම් කාල පදනම මත අදාළ කාල පරිච්ඡේදය තුළ කපා හරිනු ලැබේ.

**(ආ)අනෙකුත් ණයගැතියෝ**

අනෙකුත් ණයගැතියන් පිරිවැයෙන් හානිකරණය අඩු කළ වටිනාකමට හඳුනාගෙන ඇත.

**2.7මුදල් සහ මුදල් හා සමාන දෑ**

ඒවායේ සාධාරණ අගයෙහි වෙනස්වීමට නොසැලකිය යුතු තරමේ අවදානමකට භාජනය වන අත්පත් කර ගත් දින සිට මාස 03 ක් කල් පිරුණු හෝ ඊට අඩු කල් පිරීමක් සහිත සහ සමූහය විසින් එහි කෙටිකාලීන වගකීම් කළමනාකරණය සඳහා යොදා ගන්නා මුදල් ශේෂ සහ ඉල්ලුම් තැන්පතු වලින් මුදල් සහ මුදල් හා සමාන දෑ සමන්විත වේ.

**2.8මූල්‍ය වගකීම්**

**2.8.1ආරම්භක හඳුනා ගැනීම හා මැනීම.**

LKAS 39 අනුව මූල්‍ය වගකීම් වර්ග කොට ඇත්තේ , උචිත පරිදි ලාභය හෝ අලාභය මඟින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වගකීම් හෝ ණය හෝ ණයට ගැනීම්ය. සංස්ථාව එහි මූල්‍ය වගකීම් ආරම්භක හඳුනා ගැනීම අනුව වර්ගීකරණය නිශ්චය කර ඇත. සියළු මූල්‍ය වගකීම් මුලින්ම සාධාරණ අගයට හඳුනා ගන්නා අතර , ණය හා ණය ගැනුම් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය ක්‍රමය භාවිතා කරයි. මෙහි ඍජුවම අදාළ වන ගනුදෙනු පිරිවැය ඇතුළත්ය.

සංස්ථාවේ මූල්‍ය වගකීම් වල වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ඇතුලත්ය.

**2.8.2 <u>පසුකාලීන මිනුම්</u>**

මූල්‍ය වගකීම් මිනුම පහත දැක්වෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

**2.8.3<u>ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම්</u>**

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම් වල වෙළදාම සඳහා වූ මූල්‍ය වගකීම් සහ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම් මත නම් කරන ලද ඒවා ඇතුළත් වේ. මූල්‍ය වගකීම් , වෙළදාම සඳහා පවත්නා දේ ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ ඒවා නුදුරේදී විකිණීමේ අරමුණ ඇත්නම්ය. වෙළදාම සඳහා වගකීම් මත ලැබීම් හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. සංස්ථාව කිසිදු මූල්‍ය වගකීමක් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට මූලික හඳුනා ගැනීම නම් කර නැත.

**2.9<u>අනෙකුත් මූල්‍ය වගකීම්</u>**

ණය සහ ණය ගැනුම් ආරම්භක හඳුනා ගැනීමෙන් පසු අනෙකුත් මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් ක්‍රමාක්ෂය ක්‍රමය භාවිතා කරයි.

**2.10<u>අනෙකුත් වගකීම්</u>**

අනෙකුත් වගකීම් වල උපචිත වියදම් ද ඇතුලත්ය. මේවා ඒවායේ සාධාරණ අගය ලෙස සැලකෙන ඓතිහාසික වටිනාකමට දක්වා ඇත.

**2.11<u>රජයේ ප්‍රදාන</u>**

වත්කම් වලට අදාළ රජයේ ප්‍රදාන මේවා ශේෂ පත්‍රයේ විලම්භනය කර අදාළ වත්කමේ ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශනයට හඳුනා ගනු ලබන අතර , වියදම් පියවීම සඳහා ලැබෙන්නා වූ ලැබීම් , ලැබීම් පදනම මත ගිණුම්ගත කෙරේ.

**භාණ්ඩාගාර ප්‍රදානයන් භාවිතය සමඟ නිසි පරිදි ආදායමට හඳුනා ගැනීම.**

LKAS 20 අනුව වත්කම් ගොඩනැගීමට අදාලව රාජ්‍ය භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයන් වත්කමෙහි ආයු කාලය පුරා ආදායමට හඳුනා ගැනීම 2016වර්ෂයට හඳුනා ගත් ආදායම් පහත සඳහන් වේ.

| | | රු.ශත |
|---|---|---|
| නව ගොඩනැගිල්ල | - | 1,293,258.53 |
| සිනමා සංකීර්ණය | - | 7,314,324.52 |
| මෝටර් රථ | - | 1,845,357.25 |
| ප්‍රධාන කාර්යාලය | - | 4,220,506.97 |
| චිත්‍රාගාර යන්ත්‍රසූත්‍ර | - | 5,948,865.88 |
| | | 20,622,343.15 |

ආයතනයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු මුදල - **රු.74,250,000**

## 2.12සේවක ප්‍රතිලාභ

**නිර්ණය කළ දායක සැලැස්ම**

අදාළ ව්‍යවස්ථා හා රෙගුලාසි ප්‍රකාර , සේවක අර්ථසාධක අරමුදල් හා සේවා භාර අරමුදල් දායකත්වය සඳහා සේවකයෝ හිමිකම් ලබති. සංස්ථාව විසින් සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත ස්ථාවර දායකයක් මෙකී අරමුදල් වලට ගෙවන අතර , ඉන් අමතරව නීතිමය හෝ හෝ අර්ථකාරී බැඳීමක් සංස්ථාව කෙරෙහි නොමැත.

**නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම්**

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු නිශ්චිත දායකත්ව සැලසුමකට වෙනස් වූ පශ්චාත් සේවා නියුක්ත ප්‍රතිලාභ සැලසුමක් වේ. මේ සම්බන්ධව 1983 අංක.12 දරන පාරිතෝෂික පනත යටතේ සංස්ථාව බැඳී සිටී.

## 2.13ආදායම

### 2.13.1 නිෂ්පාදක ණය පොලිය හා අධි භාරය

නිෂ්පාදකයින් වෙත ලබා දී ඇති ණය මුදල් සඳහා පොලිය ගිණුම්ගත කර ඇත්තේ අදාළ චිත්‍රපට ප්‍රදර්ශනය වී අවුරුද්දක් ගත වන තෙක් පමණි. යම් අවස්ථාවක ණය මුදල් සම්පූර්ණ අය වන්නේනම් අදාල පොලියද ගණනය කර අය කිරීමට කටයුතු කරනු ලැබේ.

සිනමාශාලා වලින් අය වීමට ඇති මුදල් සඳහා ගැසට් නිවේදනයේ පරිදි අධිභාරය ගණනය කර ගිණුම්ගත කර තිබේ.

### 2.13.2 ප්‍රදර්ශනය සඳහා මුදා හැර ඇති චිත්‍රපට

චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේදී ආදායම නොලැබීම මත ණය මුදල් අය නොවීමේ තත්ත්වයක් තුළ චිත්‍රපට මුදා හැර වසරකට පසු පොලිය ගිණුම්ගත කරනු නොලැබේ.

### 2.13.3 ප්‍රදර්ශනය නොවූ චිත්‍රපට

**(අ)**චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය ලබා දී ඇති එහෙත් පසුගිය වර්ෂ දෙකක සේවාවන් ලබාගෙන නොමැති චිත්‍රපට වලට පොලිය ගිණුම්ගත කර නොමැත.

**(ආ)**චිත්‍රාගාර සේවා ලබා දීමේදී දීර්ඝ කාලයක් තුළ සේවාවන් ලබා නොගෙන නිෂ්පාදන කටයුතු නවතා ඇති චිත්‍රපට සඳහා පොලිය ගිණුම්ගත කොට නොමැත.

ඉහත සඳහන් කරුණු 02 යටතේ වර්ෂයේ පොලිය ගණනය නොකලද , යම් අවස්ථාවක මෙම ණය මුදල් අය කර ගැනීමේදී පොලිය අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

### 2.13.4සිනමාහල් අධිභාර

සිනමාශාලා වලින් ලැබිය යුතු චිත්‍රපට කුළිය සඳහා අයවිය යුතු අධිභාර මුදලින් 100% ක් නොලැබේය යන පදනම මත 25% ක් පමණක් ආදායමට ගෙන තිබේ.

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2016.12.31දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

| | | 2016 | 2015 |
|---|---|---|---|
| **(03) විකුණුම්** | | රු. | රු. |
| එළිය කැවූ චිත්‍රපට | **3.1** | 51,357,509 | 47,198,999 |
| ප්‍රදර්ශන | **3.2** | 522,273 | 390,026 |
| චිත්‍රාගාරය | **3.3** | 2,345,086 | 2,288,688 |
| වෙළඳ කටයුතු | **3.4** | 3,275,742 | 3,716,434 |
| | | **57,500,610** | **53,594,147** |

| **3.1 එළිය කැවූ චිත්‍රපට** | 2016 | 2015 |
|---|---|---|
| දේශීය චිත්‍රපට කුළිය | - | 34,166 |
| පෙරදිග චිත්‍රපට කුළිය | 6,609 | - |
| *බෙදා හැරීමේ කොමිස්* | | |
| දේශීය | 15,722,745 | 18,889,785 |
| විදේශීය | 21,359,098 | 16,653,226 |
| වැඩිවීම | 8,333,107 | 7,789,740 |
| සේවාවන් සඳහා කොමිස් | 182,547 | 148,724 |
| අධිභාරය | 4,405,363 | 3,253,073 |
| පරීක්ෂණ දඩ මුදල් | 1,348,040 | 430,285 |
| | **51,357,509** | **47,198,999** |

| **3.2 ප්‍රදර්ශන** | 2016 | 2015 |
|---|---|---|
| සිනේ ඇඩ්ස් | 522,273 | 390,026 |
| | **522,273** | **390,026** |

| **3.3 චිත්‍රාගාරය** | චිත්‍රපට ප්‍රමාණය | 2016 | චිත්‍රපට ප්‍රමාණය | 2015 |
|---|---|---|---|---|
| ශබ්ද | 24 | 2,207,411 | 45 | 2,133,488 |
| සංස්කරණය | 6 | 137,675 | 7 | 155,200 |
| රසායනාගාරය ( කළු - සුදු ) | - | - | - | - |
| | | **2,345,086** | | **2,288,688** |

| **3.4 වෙළඳ කටයුතු** | ප්‍රමාණය | 2016 | ප්‍රමාණය | 2015 |
|---|---|---|---|---|
| සිනමා කාබන් | 18,500 | 989,377 | 45,950 | 2,307,960 |
| අමතර කොටස් | | 15,289 | - | 21,168 |
| ලිපි ද්‍රව්‍යය | | 1,709,241 | - | 1,342,237 |
| අභ්‍යන්තර භාවිතය | | | | |
| අමතර කොටස් - | | 8,882 | | 6,100 |
| ලිපි ද්‍රව්‍යය පිරිවැය | | 552,953 | | 38,969 |
| | | **3,275,742** | | **3,716,434** |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2016.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

**(04)** විකුණුම් පිරිවැය

| | ප්‍රදර්ශන | චිත්‍රාගාරය | පොදු පරිපාලන වියදම් | **2016** එකතුව | **2015** එකතුව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| තොගය 2016.01.01 | 5,253,887 | 1,675,196 | 6,006,058 | 12,935,141 | 15,209,342 |
| එකතු කළා : | | | | | |
| මිලදී ගැනීම් හා මාරු කිරීම් | - | - | 1,889,126 | 1,889,126 | 3,025,486 |
| | 5,253,887 | 1,675,196 | 7,895,184 | 14,824,267 | 18,234,828 |
| අඩු කළා : | | | | | |
| තොග පාඩුවීම් | - | - | - | - | - |
| මාරු කිරීම් | - | - | - | - | - |
| 2016.12.31 අවසන් තොගය | 5,253,887 | 1,488,344 | 5,318,037 | 12,060,268 | 15,368,622 |
| | **-** | **186,852** | **2,577,147** | **2,763,999** | **2,866,206** |

දීර්ඝ සටහන් සඳහා ( 4- ඒ ) , ( 4-බී) සහ ( 4- සී ) සටහන් බලන්න.

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2016.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

**(04 - A)** විකුණුම් පිරිවැය

| | තොගය 2016.01.01 | මිලදී ගැනීම් | එකතුව | තොගය 2016.12.31 | ක්ෂයවීම් | ප්‍රචාරණය | මුළු පිරිවැය | වැඩිවීම | බෙදාහැරීමේ ලැබීම් | මුළු ලැබීම් | ලාභය / අලාභය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| එළිය කැවූ චිත්‍රපට | | | | | | | | | | | |
| දේශීය | 3 | - | 3 | 3 | - | - | - | - | - | - | - |
| බටහිර | 244 | - | 244 | 244 | - | - | - | - | - | - | - |
| පෙරදිග | 471 | - | 471 | 471 | - | - | - | - | 6,609 | 6,609 | 6,609 |
| | 718 | - | 718 | 718 | - | - | - | - | 6,609 | 6,609 | 6,609 |
| මුදා නොහල චිත්‍රපට | | | | | | | | | | | |
| දේශීය | 3,043,931 | - | 3,043,931 | 3,043,931 | - | - | - | - | - | - | - |
| බටහිර | 982,492 | - | 982,492 | 982,492 | - | - | - | - | - | - | - |
| පෙරදිග | 8 | - | 8 | 8 | - | - | - | - | - | - | - |
| එකතුව | 4,026,431 | - | 4,026,431 | 4,026,431 | - | - | - | - | - | - | - |
| | 4,027,149 | - | 4,027,149 | 4,027,149 | - | - | - | - | 6,609 | 6,609 | 6,609 |

| | | | 2016 | | 2015 |
|---|---|---|---|---|---|
| | | | රු. | | රු. |
| **තොගය 2016.01.01** | | | - | | - |
| එකතු කළා : | මිලදී ගැනීම් | | - | | - |
| | ප්‍රචාරණය | | - | | - |
| | | | - | | - |
| අඩු කළා : | තොගය | | | | |
| | 2016.12.31 | | - | | - |
| | පිරිවැය | | - | | - |
| එකතු කළා: | අනෙකුත් චිත්‍රපට | | | | |
| **තොගය 2016.01.01** | | | | | |
| I. ප්‍රතිශත පදනම මත | | 259,890 | - | 259,890 | |
| II. සිනේ සිත්තම් | | 966,848 | 1,226,738 | 966,848 | 1,226,738 |
| එකතු කළා : | වියදම් | | - | | - |
| | | | 1,226,738 | | 1,226,738 |
| අඩු කළා : | | | | | |
| | මාරු කිරීම් | | | | |
| **තොගය 2016.12.31** | | | | | |
| I. ප්‍රතිශත පදනම මත | | 259,890 | - | 259,890 | - |
| II. සිනේ සිත්තම් | | 966,848 | 1,226,738 | 966,848 | 1,226,738 |
| **මුළු පිරිවැය** | | | - | | - |

# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2016.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

**04 - 1 විකුණුම් පිරිවැය**

| | දළ සේයාපට | සිනමා කාබන් | අමතර කොටස් | රසායන ද්‍රව්‍යය | ලිපි ද්‍රව්‍යය | එකතුව 2016 | එකතුව 2015 |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ආරම්භක තොගය 2016.01.01 | 287,951 | 2,193,458 | 342,207 | - | 3,182,442 | 6,006,058 | 8,130,875 |
| එකතු කළා : | | | | | | | |
| මිලදී ගැනීම් හා මාරු කිරීම් | - | - | - | - | 1,889,126 | 1,889,126 | 3,025,486 |
| | 287,951 | 2,193,458 | 342,207 | - | 5,071,568 | 7,895,184 | 11,156,361 |
| අඩු කළා : | | | | | | | |
| තොග හානිවීම | | | | | | | - |
| 2016.12.31 අවසන් තොගය | 287,951 | 1,453,660 | 329,976 | - | 3,246,450 | 5,318,037 | 8,439,539 |
| | **-** | **739,798** | **12,231** | **-** | **1,825,118** | **2,577,147** | **2,716,822** |

# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

## 2016.12.31 දිනට අවසන් වර්ෂයේ

## ආදායම් ප්‍රකාශන සඳහා සටහන් ( චිත්‍රාගාරය )

**(04 - C)** විකුණුම් පිරිවැය

| | දළ සේයාපට | සිනමා කාබන් | අමතර කොටස් | රසායන ද්‍රව්‍යය | එකතුව 2016 | එකතුව 2015 |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ආරම්භක තොගය - 2016.01.01 | 816,569 | - | 804,537 | 54,090 | 1,675,196 | 1,824,580 |
| මිලදී ගැනීම් | - | - | - | - | - | - |
| | 816,569 | - | 804,537 | 54,090 | 1,675,196 | 1,824,580 |
| අඩු කළා : | | | | | | |
| තොග හානිවීම | - | - | - | - | - | - |
| මාරු කිරීම් | - | - | - | - | - | - |
| 2016.12.31 අවසන් තොගය | 816,569 | - | 617,685 | 54,090 | 1,488,344 | 1,675,196 |
| වර්ෂය තුළ අභ්‍යන්තර පාවිච්චිය | **-** | **-** | **186,852** | **-** | **186,852** | **149,384** |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2016.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

**සටහන : 05**

| | ප්‍රදර්ශන | චිත්‍රාගාරය | නිෂ්පාදන | පොදු පරිපාලන වියදම් | එකතුව 2016 | එකතුව 2015 |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **සේවක පාරිශ්‍රමිකය** | | | | | | |
| වැටුප් හා වේතන | 5,051,718 | 4,098,917 | 2,378,892 | 21,106,530 | 32,636,057 | 30,346,668 |
| අතිකාල, නිවාඩු පඩි හා වන්දි | 489,302 | 1,329,080 | 113,351 | 1,730,799 | 3,662,532 | 3,129,827 |
| සේවක අර්ථසාධක හා භාරකාර අරමුදලට දායක මුදල් | 1,070,936 | 875,522 | 519,571 | 4,520,144 | 6,986,173 | 4,431,721 |
| වෙනත් දීමනා | 5,338,088 | 4,496,159 | 6,627,543 | 20,307,288 | 36,769,078 | 39,703,099 |
| | **11,950,044** | **10,799,678** | **9,639,357** | **47,664,761** | **80,053,840** | **77,611,315** |

**සටහන : 06**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ගමන් හා යැපීම් දීමනා** | | | | | | |
| ගමන් වියදම් ( දේශීය ) | - | 3,040 | 55 | 63,822 | 66,917 | 146,663 |
| ( විදේශීය ) | - | - | - | 1,345,829 | 1,345,829 | - |
| යැපීම් දීමනා | - | 9,100 | 3,650 | 232,539 | 245,289 | 282,988 |
| | **-** | **12,140** | **3,705** | **1,642,190** | **1,658,035** | **429,651** |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2016.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

**සටහන : 07**

| | ප්‍රදර්ශන | චිත්‍රාගාරය | නිෂ්පාදන | පොදු පරිපාලන වියදම් | එකතුව 2016 | එකතුව 2015 |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **සැපයුම් හා උපකරණ** | | | | | | |
| ලිපි ද්‍රව්‍යය හා කාර්යාලීය උපකරණ | - | - | - | 2,001,650 | 2,001,650 | 989,498 |
| විදුලිය | - | 1,454,714 | - | 3,720,989 | 5,175,703 | 4,657,839 |
| සංග්‍රහ වියදම් | - | - | - | 184,437 | 184,437 | 313,481 |
| යාන්ත්‍රික හා විදුලි උපකරණ | - | 14,630 | - | - | 14,630 | 92,830 |
| නිල ඇඳුම් | - | - | - | - | - | 91,740 |
| | **-** | **1,469,344** | **-** | **5,907,076** | **7,376,420** | **6,145,388** |

**සටහන : 08**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **අළුත්වැඩියා කිරීම් , නඩත්තු හා ක්ෂයවීම්** | | | | | | |
| ඉන්ධන, ලිහිසි තෙල් හා රථවාහන නඩත්තු | - | - | - | 4,081,881 | 4,081,881 | 3,184,127 |
| නඩත්තු | - | 13,826 | - | 3,497,980 | 3,511,806 | 4,062,046 |
| ක්ෂයවීම් | - | 5,948,866 | - | 16,119,992 | 22,068,858 | 21,160,625 |
| | **-** | **5,962,692** | **-** | **23,699,853** | **29,662,545** | **28,406,798** |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2016.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

**සටහන : 09**

| | ප්‍රදර්ශන | චිත්‍රාගාරය | නිෂ්පාදන | පොදු පරිපාලන වියදම් | එකතුව 2016 | එකතුව 2015 |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවාවන්** | | | | | | |
| ප්‍රවාහනය | - | - | - | 103,491 | 103,491 | 123,441 |
| සම්බන්ධතා | 339,627 | 203,494 | 274,045 | 1,388,310 | 2,205,476 | 1,662,241 |
| අවශ්‍යතා | - | - | - | 4,602,415 | 4,602,415 | 4,170,873 |
| වරිපනම් බදු | - | 73,111 | - | 609,840 | 682,951 | 672,409 |
| වෙනත් සේවා | - | 1,148,468 | - | 8,566,605 | 9,715,073 | 7,757,483 |
| සේවක ණය පොලී පිරිවැය | - | - | - | 1,078,005 | 1,078,005 | 1,055,679 |
| (-) සේවක ණය පොලී ආදායම | - | - | - | (1,078,005) | (1,078,005) | (1,055,679) |
| නිෂ්පාදන ණය පොලී කපා හැරීම් | - | - | - | - | - | - |
| | **339,627** | **1,425,073** | **274,045** | **15,270,661** | **17,309,406** | **14,386,447** |

# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

## 2016.12.31 දිනට අවසන් වර්ෂයේ

## ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

**සටහන : 10**

**වෙනත් ආදායම්**

| | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |
| නිෂ්පාදන ණය පොලී | 1,048,738 | 396,064 |
| සේවක ණය පොලී | 421,828 | 411,068 |
| විවිධ ආදායම් | 548,435 | 783,290 |
| පිටස්තර රූගත කිරීම් | 4,589,458 | 2,429,418 |
| සංස්ථාවට අයත් නොවන චිත්‍රපට අළුත්වැඩියා කිරීම් සඳහා | 1,010,740 | 1,814,824 |
| ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොලී | 19,790,921 | 11,111,070 |
| අයදුම්පත් ගාස්තු | 326,000 | 260,000 |
| එන්.එෆ්.සී. සිනමාහලේ ආදායම | 4,634,048 | 2,656,250 |
| චිත්‍රපට නැරඹීම සඳහා ලැබීම් | 11,000 | 750 |
| තිරනාටක සඳහා අනුමැතිය | - | 5,000 |
| 224 ගොඩනැගිලි කුලී ආදායම | 8,160,000 | 7,740,000 |
| පාඨමාලාවන් සඳහා ලැබීම් | 945,000 | 1,176,400 |
| භාණ්ඩාගාර ලැබීම් ආදායමට හඳුනා ගැනීම් | 20,622,313 | 19,917,957 |
| විනිමය අනුපාත ගැලපීම | 17,502 | 43,326 |
| | **62,125,983** | **48,745,417** |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2016 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

සටහන : 11 - ස්ථාවර වත්කම්

| දේපල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | | පිරිවැය | වර්ෂය තුළ එකතු කිරීම් | වර්ෂය තුළ ඉවත් කිරීම් | පිරිවැය | සමුච්චිත ක්ෂයවීම් | වර්ෂය සඳහා ක්ෂයවීම් | සමුච්චිත ක්ෂයවීම් | ශුද්ධ අගය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2016.01.01 | | | 2016.12.31 | 2016.01.01 | | | 2016.12.31 |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ඒ. 01. | සින්නක්කර ඉඩම් | 174,343,458 | - | - | 174,343,458 | - | - | - | 174,343,458 |
| 02. | සින්නක්කර ගොඩනැගිලි | 135,344,302 | 9,039,008 | - | 144,383,310 | 43,900,782 | 5,576,583 | 49,477,365 | 94,905,945 |
| 03. | සිනමා සංකීර්ණය | 104,928,508 | 2,524,058 | - | 107,452,566 | 49,225,197 | 7,314,324 | 56,539,521 | 50,913,045 |
| 04. | මිනි සිනමා උපකරණ | 331,451 | - | - | 331,451 | 331,449 | - | 331,449 | 2 |
| 05. | ලී බඩු , සවි කිරීම් හා වැද්දුම් | 16,546,107 | 1,072,966 | 81,250 | 17,537,823 | 15,301,703 | 295,284 | 15,596,987 | 1,940,836 |
| 06. | කාර්යාලීය උපකරණ | 17,512,795 | 996,700 | - | 18,509,495 | 14,172,419 | 816,472 | 14,988,891 | 3,520,604 |
| 07. | මෝටර් රථ | 15,347,820 | - | 50,000 | 15,297,820 | 11,607,098 | 1,845,357 | 13,452,455 | 1,845,365 |
| 08. | චිත්‍රපට සංරක්ෂණය | 1,610,655 | - | - | 1,610,655 | 965,087 | 97,279 | 1,062,366 | 548,289 |
| 09. | පාපැදි | 18,281 | - | - | 18,281 | 18,277 | - | 18,277 | 4 |
| 10. | චිත්‍රපට උපකරණ | 910,689 | - | - | 910,689 | 614,990 | 49,280 | 664,270 | 246,419 |
| 11. | ප්‍රක්ෂේපණ උපකරණ | 480,202 | 445,000 | - | 925,202 | 453,312 | 50,209 | 503,521 | 421,681 |
| 12. | චිත්‍රාගාර යන්ත්‍ර සූත්‍ර | 93,274,760 | - | - | 93,274,760 | 67,937,521 | 5,948,866 | 73,886,387 | 19,388,373 |
| 13. | සිනමා අධ්‍යාපන උපකරණ | 1,241,350 | - | - | 1,241,350 | 736,132 | 75,204 | 811,336 | 430,014 |
| 14. | සුභසාධන උපකරන | 194,961 | - | - | 194,961 | 194,960 | - | 194,960 | 1 |
| | | **562,085,339** | **14,077,732** | **131,250** | **576,031,821** | **205,458,927** | **22,068,858** | **227,527,785** | **348,504,036** |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

## 2016 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

| | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| සටහන : 12 | | |
| දිගු කාලීන ආයෝජන | | |
| සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | 127,000 | 127,000 |
| | **127,000** | **127,000** |
| | | |
| සටහන : 13 | | |
| කෙටි කාලීන ආයෝජන | | |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු සේවක | 5,000 | 5,000 |
| ස්ථාවර තැන්පතු | 17,891,742 | 16,826,422 |
| රිපෝ තැන්පතු | 173,871,346 | 104,667,166 |
| භාණ්ඩාගාර බිල්පත් | 92,031,681 | 85,588,683 |
| | **283,799,769** | **207,087,271** |
| | | |
| සටහන : 14 | | |
| තොග | | |
| චිත්‍රපට | 5,253,887 | 5,253,887 |
| වෙළඳ කටයුතු | 5,318,037 | 8,151,588 |
| චිත්‍රාගාරය | 1,000,820 | 1,675,196 |
| චිත්‍රාගාරය නඩත්තු අමතර කොටස් | 1,472,575 | 1,472,575 |
| ලිපි ද්‍රව්‍යය හා වෙනත් | 1,925,189 | 1,372,994 |
| | 14,970,508 | 17,926,240 |
| සෙමින් අලෙවි වන සහ අලෙවි නොවන තොග සඳහා වෙන් කිරීම් | (8,597,176) | (8,597,176) |
| | **6,373,332** | **9,329,064** |
| | | |
| සටහන : 15 | | |
| ණයගැතියෝ | | |
| සිනමාහල් | 200,467,136 | 176,366,114 |
| නිෂ්පාදකයෝ | 120,625,829 | 101,027,511 |
| | 321,092,965 | 277,393,625 |
| අඩු කළා :- | | |
| ණයගැතියන් සඳහා හානිකරන ගැලපීම ( සටහන 15 ඒ ) | (138,702,683) | (136,517,799) |
| | **182,390,282** | **140,875,826** |
| | | |
| සටහන : 16 | | |
| විවිධ ණයගැතියෝ | | |
| වෙනත් | 160,618,026 | 148,119,293 |
| විවිධ ණයගැතියෝ සඳහා හානිකරන ගැලපීම( සටහන 15 ඒ ) | (8,030,900) | (7,405,965) |
| සේවක අත්තිකාරම් | 19,394,461 | 18,302,509 |
| සේවක ණය වත්කම් ගිණුම | 9,858,711 | 5,569,131 |
| (-) සේවක ණය වගකීම් ගිණුම | (9,858,711) | (5,569,131) |
| | **171,981,587** | **159,015,837** |

**අඩමාන ණය සඳහා වෙන් කිරීම් උපලේඛනය**

සටහන : 15 ඒ

| ණයගැතියෝ | එකතුව 2016 | එකඟ නොවූ හා අය කර ගත නොහැකි | අය කර ගත හැකි | 5% වෙන් කිරීම | මුළු වෙන් කිරීම |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| සිනමාහල් | 200,467,136 | 66,089,856 | 134,377,280 | 6,718,800 | 72,808,656 |
| නිෂ්පාදකයන් | 120,625,829 | 63,013,427 | 57,612,402 | 2,880,600 | 65,894,027 |
| වෙනත් | 160,618,026 | - | 160,618,026 | 8,030,900 | 8,030,900 |
| සේවක අත්තිකාරම් | 19,394,461 | - | 19,394,461 | - | - |
| | **501,105,452** | **129,103,283** | **372,002,169** | **17,630,300** | **146,733,583** |

| | එකතුව | සිනමාහල් | නිෂ්පාදන | වෙනත් | සේවක අත්තිකාරම් |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| ශේෂය ඉ / ගෙ | 143,923,764 | 71,603,668 | 64,914,131 | 7,405,965 | - |
| ලාභාලාභ ගිණුමට මාරු කළා | 2,809,819 | 1,204,988 | 979,896 | 624,935 | - |
| | **146,733,583** | **72,808,656** | **65,894,027** | **8,030,900** | **-** |

| ණයගැතියන් සඳහා හානිකරන ගැලපීම් | |
|---|---|
| 2016.01.01 දිනට | 143,923,764 |
| ලාභාලාභ ගිණුමට මාරු කළා | 2,809,819 |
| ශේෂය ප/ගෙ 2016.12.31 | **146,733,583** |

# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2016 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

| | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| සටහන : 17 | | |
| තැන්පතු හා ඉදිරියට ගෙවීම් | | |
| තැන්පතු | 3,712,027 | 3,691,450 |
| අත්තිකාරම් ගෙවීම් | 2,077,522 | 315,915 |
| සුභසාධක සංගමයට අත්තිකාරම් ගෙවීම් | 36,000 | 31,000 |
| | 5,825,549 | 4,038,365 |
| නොලැබිය හැකි ණය සඳහා හානිකරන ගැලපීම | (653,728) | (681,128) |
| | **5,171,821** | **3,357,237** |
| සටහන : 18 | | |
| මුදල් හා බැංකු ශේෂ | | |
| මහජන බැංකුව - ජ. ගි. අ. 004-1-001-1-0208647 | 10,607,968 | 681,468 |
| මහජන බැංකුව - ජ. ගි. අ. 055-1-001-5-0667533 | 949,309 | 873,874 |
| මහජන බැංකුව - ජ. ගි. අ. 004-1-001-6-0208664 | 2,076,534 | 8,059,708 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323272 | 2,920,580 | 10,456,100 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323131 | 1,530,342 | 537,256 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323354 | 2,124,038 | 41,475,925 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323363 | 16,432,069 | 5,707,301 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 0005002189 | 65,023 | 23,023 |
| | 36,705,863 | 67,814,655 |
| අත ඉතිරි මුදල් | | |
| සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය | 23,085 | 28,171 |
| සුළු මුදල් - චිත්‍රාගාරය | 2,101 | 1,644 |
| සුළු මුදල් - චිත්‍රපට ගබඩාව | 34 | 34 |
| | 25,220 | 29,849 |
| එකතුව | **36,731,083** | **67,844,504** |
| සටහන : 19 | | |
| ප්‍රදානයන් | | |
| භාණ්ඩාගාර ප්‍රදානයන් | 166,944,856 | 166,862,813 |
| (-)ක්‍රමක්ෂය | 20,622,313 | 19,917,957 |
| | **146,322,543** | **146,944,856** |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

## 2016 දෙසැම්බර් 31 දිනට

## මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

| | 2016 | 2015 |
|---|---|---|
| | රු. | රු. |

සටහන : 20

පාරිතෝෂික වෙන් කිරීම්

| | | |
|---|---|---|
| ඉදිරියට ගෙනා ශේෂය - 2016.01.01 | 49,392,704 | 34,060,813 |
| 2015 වර්ෂයේ අධි වෙන් කිරීම | (16,830,608) | - |
| වර්ෂය සඳහා වෙන් කිරීම් | 7,131,335 | 20,485,019 |
| මුදල් ගෙවීම් | (3,760,528) | (5,153,128) |
| | **35,932,903** | **49,392,704** |

(භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර ඇත.)

සටහන : 21

තැන්පතු

| | | |
|---|---|---|
| එන්.එෆ්.සී. සිනමාශාලා ඇප තැන්පතු | 130,000 | 60,000 |
| ආපනශාලා තැන්පතු | 30,000 | 30,000 |
| ආරක්ෂක තැන්පතු - සිනමාශාලා | 2,326,727 | 2,326,727 |
| සේවක | 5,000 | 5,000 |
| චිත්‍රපට ආනයන | 7,500 | 7,500 |
| සිනමා ව්‍යාපෘතිය | 45,000 | 45,000 |
| | **2,544,227** | **2,474,227** |

සටහන : 22

චිත්‍රපට කුලී ණයහිමියෝ

| | | |
|---|---|---|
| චිත්‍රපට කුලී ණයහිමියෝ | 293,603,604 | 260,708,496 |
| (-) ණයහිමියන් සඳහා හානිකරන ගැලපීම | (18,046,804) | (18,046,804) |
| | **275,556,800** | **242,661,692** |

<u>ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව</u>

<u>2016 දෙසැම්බර් 31 දිනට</u>

<u>මූල්‍ය තත්ත්වය සඳහා සටහන්</u>

<u>සටහන : 23</u>

**<u>වෙනත් ණයහිමියෝ</u>**

| | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| උපචිත වියදම් | 14,841,780 | 5,953,251 |
| ගෙවිය යුතු එකතු කල අගය මත බඳු | 152,613 | 152,613 |
| විගණන ගාස්තු ප්‍රතිපාදන | 1,586,720 | 1,486,720 |
| දේශීය ආදායම් කොමසාරිස් (මුද්දර) | 36,455 | 43,030 |
| හිමිකම් නොපැවේතන | 998,494 | 1,025,537 |
| සේවක අර්ථසාධක අරමුදල | 654,342 | 663,353 |
| සේවක භාරකාර අරමුදල | 74,103 | 73,858 |
| විවිධ ණයහිමියෝ | 1,599,863 | 2,005,794 |
| (-) නොගෙවිය යුතු වගකීම් සඳහා වෙන් කිරීම් | (644,840) | (644,840) |
| විවිධ ණයගැතියෝ (බැර ශේෂය) | 1,110,955 | 1,245,505 |
| චිත්‍රපට කුලී ණයගැතියෝ | 3,982,955 | 3,477,940 |
| මහා භාණ්ඩාගාරය | 5,000,000 | 5,000,000 |
| ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල | 3,525,795 | 3,525,795 |
| රිත්මා මණ්ඩල පාලන ගිණුම | 4,696,303 | - |
| සිනේ තරු පුංචි තාරකා | - | 31,750 |
| චිත්‍රපට උත්සව සඳහා වෙන් කිරීම් ගිණුම | 10,000,000 | 5,000,000 |
| උපයන විට බදු ගෙවීම | 24,243 | 37,939 |
| වැටුප් හා වේතන වෙන් කිරීමේ ගිණුම | 714,182 | 714,182 |
| ලැබිය යුතු නිෂ්පාදන ණය පොලී වෙන් කිරීම | 3,460,722 | 5,381,452 |
| | **51,814,685** | **35,173,879** |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

**2016 දෙසැම්බර් 31 දිනට**

**ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්**

| වෙනත් සේවා | එකතුව 2016 රු. | ප්‍රදර්ශන රු. | චිත්‍රාගාරය රු. | නිෂ්පාදන රු. | පොදු පරිපාලන වියදම් රු. |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂක ගාස්තු | 718,170 | - | - | - | 718,170 |
| ප්‍රචාරණය | 393,502 | - | - | - | 393,502 |
| විශේෂ කොමිෂන් ගාස්තු | 146,812 | - | - | - | 146,812 |
| නීති ගාස්තු | 916,197 | - | - | - | 916,197 |
| සංස්ථා උලෙලයන් | 1,295,332 | - | - | - | 1,295,332 |
| විගණන ගාස්තු | 600,000 | - | - | - | 600,000 |
| ආරක්ෂක සේවා | 2,200,511 | - | 1,148,468 | - | 3,348,979 |
| බැංකු ගාස්තු | 73,177 | - | - | - | 73,177 |
| විවිධ වියදම් | - | - | - | - | - |
| සිනමා අධ්‍යාපන | 847,050 | - | - | - | 847,050 |
| පිටස්තර මරණාධාර හා සිනමා ශිල්පීය වියදම් | 1,105,538 | - | - | - | 1,105,538 |
| නව සිනමාහලේ වියදම් | 35,928 | - | - | - | 35,928 |
| රඳවා ගැනීමේ බඳු | 157,836 | - | - | - | 157,836 |
| විනිමය අනුපාත ගැලපීම | - | - | - | - | - |
| තිර නාටක කියවීම | 3,000 | - | - | - | 3,000 |
| චිත්‍රපට නැරඹීම | - | - | - | - | - |
| ප්‍රමාද ගාස්තු | 64,177 | - | - | - | 64,177 |
| ටෙන්ඩර් වියදම් | - | - | - | - | - |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම | 9,375 | - | - | - | 9,375 |
| | **8,566,605** | **-** | **1,148,468** | **-** | **9,715,073** |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

**2016 දෙසැම්බර් 31 දිනට**

**ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්**

| | එකතුව 2016 රු. | ප්‍රදර්ශන රු. | චිත්‍රාගාරය රු. | නිෂ්පාදන රු. | පොදු පරිපාලන වියදම් රු. |
|---|---|---|---|---|---|
| ප්‍රවාහනය | **103,491** | **-** | **-** | **-** | **103,491** |
| සම්බන්ධතා | **2,205,476** | **339,627** | **203,494** | **274,045** | **1,388,310** |
| <u>අවශ්‍යතා</u> | | | | | |
| අභ්‍යන්තර පාවිච්චිය | 561,835 | - | - | - | 561,835 |
| විදේශීය චිත්‍රපට උළෙල | 6,912 | - | - | - | 6,912 |
| සුහසාධක වියදම් | 3,341,482 | - | - | - | 3,341,482 |
| සේවක බඳවා ගැනීම් හා පුහුණුව | 277,110 | - | - | - | 277,110 |
| ජල බිල්පත් | 415,076 | - | - | - | 415,076 |
| | **4,602,415** | **-** | **-** | | **4,602,415** |
| වරිපනම් බදු | **682,951** | **-** | **73,111** | **-** | **609,840** |

# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

## 2016.12.31 දිනට අවසන් වර්ෂයේ

## විස්තීරණ ආදායම් ප්‍රකාශනය

**2015.12.31 දිනට අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය**

| | | SLFRS 2015 රු. | මැනිය හැකි වෙනස්වීම් රු. | SLFRS 2015 රු. |
|---|---|---|---|---|
| විකුණුම් | | 53,594,147 | - | 53,594,147 |
| අඩු කළා : විකුණුම් පිරිවැය | | 2,866,206 | - | 2,866,206 |
| දළ ලාභය | | 50,727,941 | - | 50,727,941 |
| අඩු කළා : වියදම් | | | | |
| සේවක පාරිශ්‍රමික | | 77,611,315 | - | 77,611,315 |
| ගමන් හා යැපීම් දීමනා | | 429,651 | - | 429,651 |
| සැපයුම් හා උපකරණ | | 6,145,388 | - | 6,145,388 |
| අළුත්වැඩියා කිරීම් නඩත්තු හා ක්ෂයවීම් | | | | |
| (ඒ) අළුත්වැඩියා කිරීම් හා නඩත්තු ක්ෂයවීම් | | 28,406,798 | - | 28,406,798 |
| ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | | 14,386,447 | - | 14,386,447 |
| බොල් ණය සඳහා වෙන් කිරීම් | | 10,995,465 | - | 10,995,465 |
| පාරිතෝෂික වෙන් කිරීම් | සටහන 01 | 20,485,019 | 16,855,253 | 3,629,766 |
| චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල් සඳහා වෙන් කිරීම් | | 200,000 | - | 200,000 |
| තොග හානි | | - | - | - |
| | | 158,660,083 | 16,855,253 | 141,804,830 |
| පොදු පරිපාලන වියදම් අන්තර්ග්‍රහණය කිරීම් | | - | - | - |
| | | 158,660,083 | 16,855,253 | 141,804,830 |
| මෙහෙයුම් ලාභය / අලාභය | | (107,932,142) | (16,855,253) | (91,076,889) |
| එකතු කළා : වෙනත් ආදායම් | සටහන 02 | 48,745,417 | (1,105,113) | 47,640,304 |
| වර්ෂයේ ලාභය / අලාභය | | (59,186,725) | 15,750,140 | (43,436,585) |
| අඩු කළා : භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් | | 80,000,000 | - | 80,000,000 |
| | | 20,813,275 | 15,750,140 | 36,563,415 |
| අඩු කළා : බදු සඳහා වෙන් කිරීම් | | - | - | - |
| ඌනතාවය / අතිරික්තය | | **20,813,275** | **15,750,140** | **36,563,415** |

**<u>ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව</u>**

**<u>2016 දෙසැම්බර් 31 දිනට</u>**

**<u>සටහන්</u>**

**<u>ඇමුණුම</u>**

| සටහන | විස්තරය | මුදල<br>රු,ශත |
|---|---|---|
| **සටහන 01** | පාරිතෝෂික අධි වෙන් කිරීම | (16,855,253) |
| **සටහන 02** | රඳවා ගැනීමේ බදු ( ස්ථාවර තැන්පතු පොලී සඳහා අය කරන බද්ද ) | 3,180,320 |
| | ගිණුම්ගත කිරීම නිවැරදි කිරීම | 458,868 |
| | විගණණ ගාස්තු අධි වෙන් කිරීම | (30,470) |
| | වැඩියෙන් ගිණුම්ගත කර ඇති නිෂ්පාදන ණය පොලී | (2,503,605) |
| | | **(15,750,140)** |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2016 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

**සටහන : 24**
**අධ්‍යක්ෂ මණ්ඩල සබදතා**

ආයතනයේ මූල්‍ය හා මෙහෙයුම් තීරණ වලට බලපෑම් සිදු කළ හැකි කිසිදු ගණුදෙනුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කර නොමැත. 2016 වසරේ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් පහත දක්වා ඇත.

| අං. | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම | පත් කල දිනය | දරන තනතුර හා සේවා ස්ථානය / ලිපිනය | ලිපිනය | සම්බන්ධිත පාර්ශවයන්ගේ ගණුදෙනුවේ ස්වභාවය |
|---|---|---|---|---|---|
| 1 | නීතිඥ දීපාල් චන්ද්‍රරත්න මහතා | 2015.03.04 | අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති<br>සභාපති - ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව | සභාපති ,<br>ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව,කොළඹ 07. | - |
| 2 | සම්පත් සුබසිංහ ආරච්චි මහතා | 2015.06.19 | ක්‍රියාකාරී අධ්‍යක්ෂක - ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව | ක්‍රියාකාරී අධ්‍යක්ෂ ,<br>ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව,කොළඹ 07. | - |
| 3 | ආචාර්ය රංග කලන්සූරිය | 2016.06.07 | අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික<br>( නිල බලයෙන් )<br>ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් -<br>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | අධ්‍යක්ෂ ,<br>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,<br>කොළඹ 05. | - |
| 4 | ජීරානන්ද හෙට්ටිආරච්චි මහතා | 2016.06.07 | අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික<br>( නිල බලයෙන් )<br>අධ්‍යක්ෂ ජනරාල් -<br>ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | අධ්‍යක්ෂ ජනරාල් ,<br>ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ,<br>කොළඹ 07. | - |
| 5 | අනුෂා ගෝකුල ප්‍රනාන්දු මහත්මිය | 2016.06.07 | අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික(නිල බලයෙන්)<br>සංස්කෘතික අධ්‍යක්ෂ -සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | සංස්කෘතික අධ්‍යක්ෂ ,<br>සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ,<br>සෙත්සිරිපාය , බත්තරමුල්ල. | |
| 6 | විශේෂඥ වෛද්‍ය අනිල් සමරනායක මහතා | 2015.05.14 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>නියෝජ්‍ය පළාත් සෞඛ්‍යය සේවා අධ්‍යක්ෂ - බස්නාහිර පළාත | අංක.182/1 , හිල් විදිය , දෙහිවල. | - |
| 7 | අමල් අල්විස් මහතා | 2015.05.14 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අංක.300, පාක් පාර , කොළඹ 05. | - |
| 8 | පී. වී. පි. දයාරත්න මහත්මිය | 2015.02.06 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අංක. 59/3 , හීනටිකුඹුර ,<br>තලංගම උතුර , බත්තරමුල්ල. | - |
| 9 | නයන හෙට්ටිආරච්චි මහතා | 2015.04.06 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අංක.330/8 , සමන් මාවත , වැවපාර ,<br>බොරලැස්ගමුව. | - |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } සීඑස්/සී/එන්එෆ්සී/1/16/එෆ්ජ් ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2018 අප්‍රේල් 30 දින

සභාපති,

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 31(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2018 අප්‍රේල් 10 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 –1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම

1999 වර්ෂයේදී ජාතික චිත්‍රපට සංස්ථාව සතුව පැවති චිත්‍රපටි බෙදාහැරීමේ ඒකාධිකාරය අහෝසි කිරීමත් සමඟ සංස්ථාව සතුව පැවති ප්‍රධාන ආදායම් මාර්ගයක් වූ බෙදාහැරීමේ කොමිස් මුදල අහිමි වී තිබුණි. ඒ හේතුවෙන් සංස්ථාවේ ආදායම වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් නොවීම මත මහා භාණ්ඩාගාරය විසින් 2011වර්ෂයේ සිට සේවක වැටුප් සඳහා ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කර තිබුණි.

තවද, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක කාලය තුල සංස්ථාව භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර දිගින් දිගටම අලාභ ලැබීමේ තත්ත්වයක් නිරීක්ෂණය වූ අතර ඒ අනුව රජයේ මූල්‍ය සහායක් නොමැතිව සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාම අවිනිශ්චිත තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

## 1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික චිත්‍රපට සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7**

ප්‍රමිතයේ 7 වන වගන්තිය අනුව, භාණ්ඩාගාර බිල්පත් සහ ප්‍රතිවිකුණුම් බිල්පත් ගිණුම්ගත කිරීමේදී මාස 3ක් හෝ ඊට අඩු ආයෝජනයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා සමාන ද්‍රවශීල වත්කමක් ලෙස පෙන්නුම් කළ යුතු වුවද මාස තුනක කාලයක් තුළදී කල්පිරීමට නියමිත භාණ්ඩාගාර බිල්පත් වටිනාකම රු.9,612,350 ක් හා බිල්පත් ප්‍රතිවිකුණුම් රු.103,361,405 ක් මුදල් හා මුදල් සමාන ද යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

---

(i) ප්‍රමිතයේ 79(අ) ඡේදය ප්‍රකාරව නිෂ්කාර්ය වත්කම් පිළිබඳව ගිණුම් ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වුවත් සංස්ථාවේ කැලණිය විත්‍රාගාරයේ කලුසුදු සහ වර්ණ රසායනාගාර වලට අයත් තාක්ෂණය යල්පැනගිය පැරණි වත්කම්, ගිණුම්ගත කිරීම හා ඒ පිළිබඳව හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 79 (ආ) ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 250,899,989 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

---

ප්‍රමිතයේ 57 ඡේදය ප්‍රකාරව ආයුගණක තක්සේරුවක් සිදුකර පශ්වාත් සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් ගණනය කළ යුතු වුවත්, ඊට පටහැනිව ආයතනය විසින් පශ්වාත් සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගැනීමකින් තොරව සෑම සේවකයකුටම සේවය කරන ලද එක් වර්ෂයකට මාස භාගයක වැටුපට සමාන පාරිතෝෂික මුදලක් වෙන්කර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37

---

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 2006 ජනවාරි සිට 2015 දෙසැම්බර් දක්වා ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගෙන දායක මුදල් ගණනය කිරීම නිසා රු. 2,763,753 ක හිඟ මුදලක් සහ රු. 1,381,876 ක අධිභාරය ගෙවීමට සිදුව තිබූ අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2017 අප්‍රේල් 27 ලබා දී තිබුණද ප්‍රමිතය පරිදි ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38

---

ප්‍රමිතයේ 119 ඡේදය ප්‍රකාරව කැලණිය සරසවි විත්‍රාගාරයේ පශ්වාත් නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කරන මෘදුකාංගය මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම් යටතේ දැක්විය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 40

ප්‍රමිතයේ 75(ඇ) ඡේදය ප්‍රකාරව ආයෝජන වත්කම් හඳුනාගෙන ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු වුවත් සංස්ථාව විසින් වසර 15 ට වැඩි කාලයක් තුළ ආයතන තුනකට කුලියට ලබාදී ඇති ගොඩනැගිල්ලක් පිළිබඳව සුදුසු අනාවරණය කිරීම් සිදු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

දේපල පිරිවැයට හෝ තක්සේරු අගයට ගිණුම්ගත කිරීම ප්‍රතිපත්තිය බව මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද සංස්ථාවට අයත් බෞද්ධාලෝක මාවතේ පිහිටි වරිපනම් අංක 224 ඉඩම සහ කැලණිය චිත්‍රාගාරයේ ඉඩම 2007 වර්ෂයේදී අවසාන වරට තක්සේරු කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වසර 10 ක් ගත වී තිබුණද මෙම ඉඩම් නැවත තක්සේරු කර සධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

දිගුකාලීන තැන්පතුවක් වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පතු වටිනාකම රු. 17,891,742 ක් කෙටිකාලීන ආයෝජනයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂ විගණනය සඳහා ඉදිරිපත් කළ උපලේඛන /ලෙජර් ශේෂයන් සමග සැසඳීමේදී රු. 13,495,075 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාවේ පොත්පත් සහ රිත්මා මණ්ඩලයේ පොත්පත් අනුව අන්තර් දෙපාර්තමේන්තු ජංගම ගිණුමක රු. 4,696,302 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ බැංකු ජංගම ගිණුමක බැංකු ශේෂය රු. 10,607,968 ක් වුවද, බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව එම ශේෂය රු. 6,607,968 ක් වූයෙන් රු. 4,000,000 ක නොසැසඳු වෙනසක් නිරීක්ෂණය විය.

## 2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ණය ගැතියන්ගෙන් වැඩිපුර අයකරගත් මුදල් අදාළ පුද්ගලයන්ට නැවත ගෙවීමට හෝ ආදායමට ගැනීම හෝ වෙනත් සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමට යොමු නොවීම හේතුවෙන් රු. 1,110,955 ක් වූ ණය ගැති බැර ශේෂ අවුරුදු 10 කට අධික කාලයක සිට ගිණුම්වල ඉදිරියට ගෙන එමින් තිබුණි.

(ආ) මරදාන සිනේසිටි සිනමා ශාලාවෙන් 2003 වර්ෂයේ සිට 2016 මැයි 31 දින දක්වා අයවිය යුතු චිත්‍රපට කුලිය රු. 12,343,433 ක් මෙම වාර්තාවේ දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර 2016 මැයි 31 දිනට පසු දෛනික වාර්තාව එවා නොමැති බැවින් අයවිය යුතු චිත්‍රපට කුලී ආදායම ගණනය කිරීමට සහ ගිණුම් වලින් අනාවරණය කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) ස්වෙච්ඡාවෙන් සේවකයින් විශ්‍රාම ගැන්වීම වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ වන්දි මුදලින් ඉතිරිව පැවති රු. 5,000,000 ක් නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණි.

(ඈ) 2001 වර්ෂයේ සිනමා ශාලාවල චිත්‍රපට බෙදා හැරීමේ කටයුතු පෞද්ගලික මණ්ඩලවලට පැවරීමට පෙර සිනමා ශාලා 163 කින් රු. 7,604,528 ක් හා පැවරීමෙන් පසු පැවති එහෙත් දැනට වසා දමා ඇති සිනමාශාලා 186 කින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු. 74,412,984 අයවිය යුතුව පැවතුණි. තවද දැනට ක්‍රියාත්මක වන මණ්ඩලවලට අයත් සිනමාශාලා වලින් අයවිය යුතු හිඟ මුදල් ප්‍රමාණය රු. 149,054,764 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී ද එම මුදල් අයකර ගැනීමට ඵලදායී පියවර ගෙන නොතිබුණි.

(ඉ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සිනමාහල් නිෂ්පාදන, වෙනත් ණය සහ සේවක අත්තිකාරම් වශයෙන් මුළු ණය එකතුව රු. 501,105,452 ක් අයකර ගත යුතුව තිබුණි. එම ණයගැතියන්ගෙන් රු. 129,103,283

ක් වූ එකහ නොවූ සහ අයකරගත නොහැකි ණය ශේෂය සඳහා සියයට 100 ක බොල් ණය ප්‍රතිපාදනයක් ද ඉතිරි ණයගැතියන් සඳහා සියයට 5 ක බොල්ණය ප්‍රතිපාදනයක් ද සිදුකර තිබුණි. කෙසේ වුවද ඉහත ණයගැතියන් ගෙන් රු. 146,733,583 ක් හෙවත් සියයට 29 ක් ආපසු අයකර ගැනීම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 381(1) | රාජකාරී බැංකු ගිණුම් ආරම්භ කිරීම සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා මගින් මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගත යුතු වුවත්, 2016 දෙසැම්බර් 31 දින වන විට සංස්ථාව විසින් බැංකු ජංගම ගිණුම් 08 ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ආරම්භ කර තිබූ අතර එදිනට එම බැංකු ගිණුම්වල ශේෂ එකතුව රු. 36,705,863 ක් වී තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 454 (1) | ඉන්වෙන්ට්‍රි භාන්ඩ ලැබීම්, නිකුත් කිරීම් සම්බන්ධයෙන් 44 පොදු ආකෘතියට අනුව ප්‍රධාන බඩු වට්ටෝරු ලේඛනයක් පවත්වා ගැනීම සිදුකර නොතිබුණු අතර, ඒ ඒ අංශ සඳහා වෙන් වෙන් වශයෙන් අදාළ ආකෘති ප්‍රකාරව ලේඛන පවත්වා නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 754 | සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම බඩු ලේඛන පොත තුළනය කර ඊළඟ මුදල් වර්ෂයට ඉදිරියට ගෙනයාම සිදු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 2015 ජූලි 22 දිනැති අමප/05/0741/041/012 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය | රාජ්‍ය ආයතනවලින් බැහැර කෙරෙන තඹ, පිත්තල, ඇලුමිනියම්, ඊයම් ආදී යකඩ නොවන ලෝහද විශේෂ වර්ගයන්හි යකඩ, වීනච්චට්ටි, හා වානේ සුන්බුන්ද ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අලෙවි කළ හැකි වුවත්, සරසවි චිත්‍රාගාරයේ පැරණි ගොඩනැගිල්ලක ගොඩගසා තිබූ යකඩ, සුන්බුන් හා දළ සේයාපට ආවරණ සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) (i)1971 මුදල් පනතේ 10(5) සහ 11වන වගන්ති සහ 1971 අංක 47 දරන චිත්‍රපට සංස්ථා පනතේ 27වන වගන්තිය | 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ වියදම් ඉක්ම වූ ආදායම රු. 111,502,287 ක් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණු අතර එම වටිනාකම ද ඇතුළත්ව රු. 92,031,681 ක් හා රු. 173,871,346 ක් 2016 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවිකුණුම් වල මුදල් ඇමතිවරයාගේ හා අදාල ඇමතිවරයාගේ අනුමැතියකින් තොරව ආයෝජනය කර තිබුණි. |
| (ii) මුදල් පනතේ 7(2) වගන්තිය | සමාලෝචිත වර්ෂයේදී රජයෙන් ලැබූ ආධාර මුදල වූ රු. 74,250,000 ක් සංස්ථාවේ ලාභය ගණනය කිරීමේදී සැළකිල්ලට නොගෙන නොතිබුණු අතර ලාභය / අලාභය ගණනය කිරීමෙන් පසුව විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පෙන්වා තිබුණි. |
| (ඈ) 1999 ජුනි 17 දිනැති ජාතික චිත්‍රපට ප්‍රතිපත්තිය හා මාර්ගෝපදේශය<br>(i) 2.1 වගන්තිය | චිත්‍රපට මුද්‍රණය හා ප්‍රචාරණය වැනි පශ්චාත් නිෂ්පාදන කටයුතු සඳහා උපරිමය රු. මිලියනයක් දක්වා ණය, මහජන බැංකුව මගින් සපයනු ලැබිය යුතු වුවත් ඊට පටහැනි ලෙස චිත්‍රපට සංස්ථාවේ අරමුදලින් රු. මිලියන 20 ක ණය මුදලක් "සරිගම" චිත්‍රපටය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව ලබා දී තිබුණි. |

| | |
|---|---|
| (ii) 9 වගන්තිය | චිත්‍රපට සුරක්ෂිතාගාරයක් පිහිටුවා එහි කළමනාකරණය චිත්‍රපට සංස්ථාව විසින් පවත්වාගෙන යා යුතු වුවත් චිත්‍රපට සංස්ථාව සතු පැරණි චිත්‍රපට 273 ක් පමණ ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සුරක්ෂිතාගාරයක තැන්පත් කර තිබුණි. කෙසේ වෙතත් 1947 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා තිරගත වූ චිත්‍රපට 962 ක් සහ නව චිත්‍රපටවල පිටපත් සුරක්ෂිත කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස්කර නොතිබුණි. |
| (ඉ) සුරාබදු නිවේදන අංක 902 හි 111 උපලේඛනයේ (ඒ) හා (සී) වගන්තිය | පූජනීය ස්ථානයකට හෝ පාසලකට මීටර් 500 ක් ඇතුළත හා රටබීම විකුණන ස්ථානයේ තිබිය යුතු වපසරිය වර්ග අඩි 500 කට අඩුනම් රටබීම අලෙවි බලපත්‍ර නිකුත් නොකළ යුතුමුත් ඒ පිළිබඳ පරීක්ෂාවකින් තොරව සිනමාහල්වලට රටබීම අලෙවි බලපත්‍ර සඳහා නිර්දේශ නිකුත් කර තිබුණි. |
| (ඊ) 1971 අංක 47 දරන චිත්‍රපට සංස්ථා පනතේ 61(2) (ඉ) වගන්තිය | ත්‍රිමාණ (3D) චිත්‍රපට සඳහා චිත්‍රපට ප්‍රදර්ශනාගාරවල අය කළ යුතු ගාස්තුව සංස්ථාව විසින් අනුමත කරන ලද ගාස්තුවට වඩා රු. 100 ක් වැඩියෙන් අයකර තිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර සංස්ථා විමර්ශණ නිලධාරීන් විසින් එවැනි අවස්ථා නිරීක්ෂණය කර නිවැරදි කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර රු.34,688,806 ක අලාභයක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.59,186,725 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.24,547,919 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. වෙනත් ආදායම් රු. 13,380,566 කින් ඉහලයාම සහ බොල්ණය හා පාරිතෝෂික වෙන්කිරීම් රු.23,539,330 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර මූල්‍ය ප්‍රතිඵලයේ අඛණ්ඩ අලාභයක් ඇති වී තිබුණු අතර 2012 වර්ෂයේදී රු. 50,487,786 ක් වූ එය සමාලෝචිත වර්ෂය අවසානයට රු.34,638,806 ක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2012 වර්ෂයේදී රු. 31,192,547 ක් වූ සංස්ථාවේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.67,483,892 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනත අනුව චිත්‍රපට නිෂ්පාදනය හා ප්‍රදර්ශනය සඳහා අවශ්‍ය පටල පට, චිත්‍රපට, ඡායාරූප උපකරණ ආනයනය, බෙදා හැරීම හා සැපයීම, චිත්‍රපට මිලට ගැනීම හා ගබඩා කිරීම ඇතුළුව චිත්‍රපට අපනයනය කිරීම සහ චිත්‍රපට නිෂ්පාදනය සඳහා චිත්‍රාගාර හා චිත්‍රපට ප්‍රදර්ශනාගාර පිහිටුවීම, පහසුකම් සැපයීම හා මූල්‍ය වශයෙන් සහය වීම, චිත්‍රපටවල නිෂ්පාදකයන්ට උපහාර දැක්වීම, ත්‍යාග හා සම්මාන ප්‍රදානය කිරීම, සාකච්ඡා හා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම හා පැවැත්වීම, චිත්‍රපට උළෙල පැවැත්වීම, චිත්‍රපට පිළිබඳ වාර සඟරා පලකිරීම හා ශ්‍රී ලංකාව ඇතුළත හා ශ්‍රී ලංකාවෙන් පිටත චිත්‍රපට සම්බන්ධයෙන් වෙළඳපල පර්යේෂණ පැවැත්වීම ආදී අරමුණු ඉටුකර ගැනීම සඳහා සංස්ථාව පිහිටුවා ඇත.එම අරමුණු ඉටුකර ගැනීමට අදාළව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රූපවාහිනී හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක කුසලතාවයන් පෙන්වා ඇති තරුණ සිනමාකරුවන්ට තම ප්‍රථම සිනමා නිර්මාණය සඳහා රාජ්‍ය අනුග්‍රහය දැක්වීම වශයෙන් වසරකට හොඳ චිත්‍රපට 04 ක් චිත්‍රාගාර නිෂ්පාදන වශයෙන් සම නිෂ්පාදනය කිරීම සඳහා රු. මිලියන 12 ක් වෙන්කර තිබුණද එම කාර්යය ඉටුකර නොතිබුණි.

(ආ) සිනමා කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ මූලික අරමුණින් චිත්‍රපට නිෂ්පාදනයෙහිලා මූල්‍යමය සහය දැක්වීම අරමුණක් වුවත් 2012 වර්ෂයේ සිට කිසිදු නිෂ්පාදන ණයක් ලබා දී නොතිබූ අතර ශ්‍රී ලංකාව ඇතුළත හා ශ්‍රී ලංකාවෙන් පිටත චිත්‍රපට සම්බන්ධයෙන් වෙළඳපල පර්යේෂණ පැවැත්වීම ආදී අරමුණු ඉටුකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) සෑම සිනමා ශාලාවක්ම අවම වශයෙන් මාසයකට එක් වතාවක් පරීක්ෂාවට ලක්වන පරිදි එනම් සමස්තයක් ලෙස දර්ශන වාර 2000 ක් වත් පරීක්ෂා කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ දර්ශන වාර 850 ක් පමණක් පරීක්ෂාවට ලක්කර තිබුණි.

(ඈ) ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව චිත්‍රපට බහුමාණ ශබ්ද (Surround Sound) මිශ්‍රණය කිරීම සඳහා විජය කුමාරණතුංග මැදිරියේ ධ්වනි පාලනය කර (Acoustic treatment) උපකරණ මිලදීගෙන සවිකිරීම සහ චිත්‍රපට සඳහා ගීත සහ සංගීතය පටිගත කිරීම සඳහා උපකරණ මිලදී ගැනීමට රු. මිලියන 30 ක් වෙන්කර තිබුණද එම කාර්යය ඉටුකර නොතිබුණි.

(ඉ) චිත්‍රපට කර්මාන්තය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමට නියමිත ඒකකයක් සංස්ථාව තුළ ස්ථාපනය කර නොතිබුණු අතර, ප්‍රේක්ෂකයන්ගෙන් හා චිත්‍රපට නිෂ්පාදකයින්ගෙන් ලැබෙන පැමිණිලි ලේඛනගත කිරීම හා පැමිණිලි අදාළ අංශ වෙත යොමුකර කාලීනව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි. තවද, චිත්‍රපට කර්මාන්තයේ උන්නතිය උදෙසා ජාතික ප්‍රතිපත්ති සැකසීමට ද කටයුතු කර නොතිබුණි. ශ්‍රී ලාංකීය සිනමාවේ අනන්‍යතාවය රකගනිමින් ජාත්‍යන්තර තත්ත්වයට ළඟාවිය හැකි නිර්මාණ බිහි කිරීම සංස්ථාවේ දැක්ම වුවත්, අවශ්‍ය මූල්‍යමය පහසුකම් ලබා නොදීම මත නවක නිෂ්පාදකවරු හට ඉදිරියට ඒමට බාධාවන් පැන නැගී තිබුණු අතර, හරවත් නිර්මාණ බිහි කිරීම වෙනුවට වානිජමය චිත්‍රපටවලට යොමු වී මුදල් ඉපයීම ප්‍රධාන අරමුණ බවට පත් වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ කම්කරුවන් 10 දෙනෙකුගේ අතිරික්තයක් පැවතියදී මාසිකව රු. 293,490ක් ගෙවීමේ එකඟතාවය මත සංස්ථාවේ පිරිසිදු කිරීම කටයුතු තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබූ පෞද්ගලික සේවා සැපයුම්කරුවකු වෙත පවරා තිබුණු අතර අවශ්‍ය සේවක සංඛ්‍යාව යෙදවීමට මෙම ආයතනය අපොහොසත් වීම හේතුවෙන් අසතුටුදායක සේවා සැපයීමක් දිගින් දිගටම සිදු කර තිබුණි.

(ආ) සංස්ථාවට සිනමා ශාලාවලින් අයවිය යුතු හිඟ මුදල් සහ චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලබාදී ඇති ණය මුදල් රු.මිලියන 192 ක් කපා හැරීම සඳහා අනුමැතිය ඉල්ලීමේ ලිපියට පිළිතුරු වශයෙන් 2015 අගෝස්තු මාසයේ අංක PE/ME/NFC/GEN/2015 දරන රාජ්‍ය ව්‍යාපාර

දෙපාර්තමේන්තු අධ්‍යක්ෂක ජනරාල්ගේ ලිපිය පරිදි පහත අඩුපාඩු සිදුවී ඇති බව නිරීක්ෂණය විය.

(i) රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳ පාර්ලිමේන්තු කමිටුව (COPE) විසින් ද නිර්දේශ කර ඇති පරිදි අමාත්‍යාංශ මට්ටමේ කමිටුවක් පත් කර හිඟ මුදල් රැස්කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කරන මෙන් උපදෙස් ලබාදී තිබුණද ,පත්කර ඇති කමිටුව සඳහා අමාත්‍යාංශයේ නියෝජනයක් සිදුවී නොතිබීම.

(ii) අදාළ ණය මුදල් අයකර ගැනීම සඳහා ඇති නෛතිකමය හැකියාව පිළිබඳ විමර්ශනය කර නොමැති වීම සහ එසේ විමර්ශනය කිරීම තුළින් හඳුනාගනු ලබන ණයගැතියන්ගෙන් නීති ප්‍රකාරව, අදාළ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම.

(iii) අවම වශයෙන්, දැනට ක්‍රියාත්මක සිනමා ශාලාවලින්, වාරික වශයෙන්, දීර්ඝ කාලීනව හෝ ලබාදී ඇති ණය මුදල් පියවා ගැනීමට විධිමත් ක්‍රියා පටිපාටියක් ඉහත ණය කමිටුවෙන් ඉදිරිපත් වී නොතිබීම.

(iv) ඉහත (ii ) හා (iii) අයකරගත හැකි ණය මුදල හැර ඉතිරි මුදල කපා හැරීම සඳහා අමාත්‍ය මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු බව දන්වා තිබුණද එසේ සිදුකර නොතිබීම.

(ඇ) සංස්ථාවේ ගොඩනැගිල්ල ස්ථාපනය කර ඇති බෞද්ධාලෝක මාවතේ වරිපනම් අංක 303 දරන ඉඩමේ නෛතික හිමිකම ලබා ගැනීමට හා ඉඩමේ වටිනාකම ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් කටයුතු කර නොතිබුණි.

## 4.3 ආර්ථික නොවූ ගනුදෙනු

---------------------------

භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවිකුණුම් කිරීමේදී එකම බැංකුවක දිගින් දිගටම ආයෝජනය කර තිබූ අතර ප්‍රාථමික වෙළඳපලේ රාජ්‍ය බැංකු වලින් මිල ගණන් කැඳවා වඩා වාසි දායක පොලී අනුපාත මත ආයෝජන කිරීම සිදුකර නොතිබුණි. මහ බැංකුව මගින් නිකුත් කරන භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ බර තැබූ සාමාන්‍ය පොලී අනුපාතයට වඩා සියයට 0.2 ක පමණ අඩු ප්‍රතිශතයකට 2016 දෙසැම්බර් 31 දිනට රු.264,903,027 ක් ආයෝජනය කර තිබුණි.

**4.4** මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ අරමුණට කිසිදු සම්බන්ධතාවයක් නොමැතිව සහ පදනම් කරගත් නෛතික විධිවිධානයකින් තොරව සංස්ථාවේ සභාපති විසින් රිත්මා මණ්ඩලයේ සිනමාශාලා 39 කට වර්ෂ කිහිපයක සිට සහ අනෙකුත් මණ්ඩල සිනමාහල් 16 ක් සමාලෝචිත වර්ෂයේදී රටබීම බලපත්‍ර නිර්දේශ කර තිබුණි.

(ආ) රාජ්‍ය අනුග්‍රහය යටතේ රටබීම බලපත්‍ර නිකුත් කිරීම ශ්‍රී ලංකා රජයේ "මතට තිත" ප්‍රතිපත්තියට එරෙහි ක්‍රියාවක් වන අතර, පවුලේ චිත්‍රපට සහ ළමා චිත්‍රපට ප්‍රදර්ශනය වන අවස්ථාවන්හිදී පවා රටබීම පානය සඳහා අවකාශය සැලසෙන පරිදි සිනමා ශාලා සඳහා රටබීම බලපත්‍ර නිර්දේශ කර තිබීම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ.

(ඇ) නිකුත් කර ඇති බලපත්‍ර ප්‍රකාරව රටබීම අලෙවි කළ හැක්කේ නරඹන්නන් සඳහා පමණක් වියයුතු වුවත් නරඹන්නන් නොවන පිරිස් වලට රටබීම අලෙවි කිරීම සහ රටබීම අලෙවි කිරීමේ අයිතිය බාහිර පුද්ගලයින්ට ලබාදී තිබූ බව නිරීක්ෂණය විය.

**4.5** අරමුදල් ඌන උපයෝජනය

---

සංස්ථාව සතු ජංගම බැංකු ගිණුම් 8 ක සාමාන්‍ය මාසික ශේෂය රු. 55,560,598 ක් වූ අතර එම මුදලින් කොටසක් කෙටිකාලීනව ආයෝජනය කිරීමෙන් අමතර ආදායමක් ලබා ගත හැකිව තිබුණද ඒ පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

**4.6** නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු. 870,659 ක් වූ දළ සේයාපට සහ රසායන ද්‍රව්‍ය තොගය 2014 වර්ෂයේ සිට නිකුත් කිරීමකින් තොරව පැවතුණි.

(ආ) වටිනාකම රු. 156,800 ක් වූ ත්‍රීරෝද රථය අළුත්වැඩියා කිරීමට රු. 200,000 ක් වැයවන හෙයින් අළුත්වැඩියා කිරීම ඵලදායී නොවන බව 2017 සැප්තැම්බර් 22 දින වාහන

යාන්ත්‍රික උපදේශක නිර්දේශ කර තිබුණද එය අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රධාන කාර්යාලයේ සුභසාධන සංගමයෙන් ලබා දී තිබූ පුස්තකාල පොත් 500 කට අධික ප්‍රමාණයක් කැලණිය සරසවි චිත්‍රාගාරය තුළ අනාරක්ෂිතව ගොඩගසා තිබීම හේතුවෙන් දිරාපත් වෙමින් පැවැතුණි.

## 4.7 ප්‍රමාද වූ ව්‍යාපෘති

සරසවි චිත්‍රාගාරයේ චිත්‍රපට පශ්චාත් නිෂ්පාදන පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා 2015 වර්ෂයේදී රු. මිලියන 30 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබී තිබූ අතර ඒ සඳහා ලංසු කැඳවා තිබුණද ඒවා සංස්ථාවේ පිරිවිතරවලට නොගැලපෙන හෙයින් අවලංගු කර තිබුණි. අවශ්‍ය පිරිවිතර සැකසීම හා ඉදිරි කටයුතු වෙනුවෙන් ඉන්දියානු උපදේශකවරයෙකුට ඇමරිකානු ඩොලර් 8,000 ක් ගෙවා තිබුණද 2017 මැයි වන විටත් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. 2017 ව්‍යාපෘතිය අධියර 03 ක් යටතේ ඉටුකරවා ගැනීමට අවශ්‍ය උපදේශක සේවා පමණක් ලබාගෙන තිබුණි.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 71 ක් වූ අතර වර්තමාන අවශ්‍යතාවයන් අනුව අනුමත කාර්ය මණ්ඩලය සමාලෝචනය කර නොතිබුණි. ඒ අනුව, අත්‍යාවශ්‍ය මාණ්ඩලික තනතුරු 02 ක්, කාලයක් තිස්සේම පුරප්පාඩු වී තිබීම හේතුවෙන් ඉහළ කළමනාකාරීත්වයේ මග පෙන්වීමක් හා අධීක්ෂණයක් යටතේ සැලසුම් සකස් කිරීමේදී, ඉලක්කයන් ගොඩනැගීමේදී හා එකී ඉලක්ක ළඟාකර ගැනීමට මෙහෙයවීමේදී ගැටළු පැන නැගිය හැකි බව නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාවේ පුරප්පාඩු වී පවතින තනතුරු පිරවීම සඳහා බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට 2016 වර්ෂයේදී සැලසුම් කර තිබුණද 2017 ජූලි 12 දින දක්වා කිසිඳු බඳවා ගැනීමක් සිදුකර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

සංස්ථාව විසින් සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණද 2016 වර්ෂයේ දී ඒ අනුව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

සංයුක්ත සැලැස්මේ අරමුණු පාදක කරගෙන සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්මේ කාර්තුමය වශයෙන් ඉලක්කගත ක්‍රියාකාරකම් හඳුනාගෙන තිබුණ ද එහි කාර්යසාධනය ඇගයීමට හැකිවන පරිදි කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

අනුමත කාර්ය මණ්ඩලයට අනුව අභ්‍යන්තර විගණන අංශයේ ස්ථිර විගණන සහායක තනතුරු 03 ක් තිබිය යුතු වුවද 2016 දෙසැම්බර් 31 දින වන විට කිසිදු සහායකයකු සේවයේ යොදවා නොතිබුණි. ඒ අනුව අභ්‍යන්තර විගණන කටයුතු සම්බන්ධයෙන් සංස්ථාව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොමැති බව නිරීක්ෂණය විය.

### 5.4 විගණන කමිටු

2003 ජූනි 02 දිනැති අංක පීඒඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් මාස තුනකට වරක්වත් විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

### 5.5 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වසර තුනක කාලයක අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා 4.2.2 අනුව ප්‍රසම්පාදන කාල සටහනක් ද, සකස් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණි. තවද ඉතා හදිසි අවශ්‍යතාවයන් ලෙස කාබන් මිලදී

ගැනීම, පරිගණක ජාල ගත කිරීම අංක තාක්ෂණ සිනමා පැකේජ තත්ත්ව පරීක්ෂණ අංකික තාක්ෂණයට පත් කිරීමට රු. මිලියන 16 ක් හා සාමාන්‍ය අවශ්‍යතාවයන් ලෙස පරිගණක උපාංග සහ විදුලි උත්පාදක යන්ත්‍ර මිලදී ගැනීමට රු. මිලියන 15 ක් වෙන්කර තිබුණද එම කටයුතු ඉටුකර නොතිබුණි.

**5.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ප්‍රකාරව 2013 හා 2014 වර්ෂවල වාර්ෂික වාර්තා 2017 මැයි 23 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) වත්කම් පාලනය | (i) චිත්‍රාගාරයේ තිබෙන නිෂ්කාර්ය වත්කම් හඳුනාගෙන අවශ්‍ය කටයුතු සිදුනොකිරීම.<br>(ii) පුස්තකාල පොත් අනාරක්ෂිත පවත්වා ගැනීම.<br>(iii) ඉන්වෙන්ට්‍රි ලේඛනය ලැබීම් නිකුත් කිරීම් හඳුනා ගැනීමට පහසු වන ආකාරයෙන් නිසි පරිදි නඩත්තු කර නොතිබීම. |
| (ආ) ණයගැති පාලනය | (i) වර්ෂ 10 කට වඩා අයනොවී පවතින ණය ශේෂ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම.<br>(ii) ණය ගිවිසුම් පිළිබඳ නිසි අධීක්ෂණයක් නොතිබීම.<br>(iii) ණය අයකර ගැනීමේ වැඩ පිළිවෙලක් හෝ අංශයක් පිහිටුවා නොතිබීම. |

| | | |
|---|---|---|
| (ඇ) ආදායම් පාලනය | (iv) | චිත්‍රපට කුලී ආදායම සහ වාර්ෂිකව අයවිය යුතු බදු මුදල් අයකර ගැනීම් පිළිබඳ අධීක්ෂණයක් නොවීම. |
| | (v) | සිනමාශාලා වලින් මුදලින් ලද ආදායම තහවුරු කර නොගෙන නිෂ්පාදකයාගේ කුලී ආදායම් කොටස ගෙවීම. |
| (ඈ) ණය පාලනය | | චිත්‍රපට ප්‍රචාරණ ණය මුදල් අයකර ගැනීමේදී ගිවිසුම් ප්‍රකාරව පළමු ආදායමින් අය නොකිරීම. |
| (ඉ) පරිගණක මෘදුකාංග පද්ධති පාලනය | (i) | එක් එක් නිලධාරියාගේ මට්ටම සඳහා හා පෞද්ගලික මුරපද ලබා නොදීම. |
| | (ii) | ප්‍රධාන ගොනුවේ දත්ත වෙනස් කිරීම මාණ්ඩලික නිලධාරියකු විසින් සිදු නොකිරීම සහ අධීක්ෂණය නොකිරීම. |
| | (iii) | ලබාගන්නා වූ උපස්ථක (backup) එම ස්ථානයේම තැබීම. |
| | (iv) | Teamviewer මෘදුකාංග සහ අන්තර්ජාල පහසුකම් මගින් පිටස්තර පුද්ගලයින්ට වැටුප් සැකසීමේ පද්ධතියට ඇතුල්වීමේ අවදානමක් පැවතීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

இலங்கை தேசிய திரைப்படக் கூட்டுத்தாபனம்

**NATIONAL FILM CORPORATION OF SRI LANKA**


අංක 303, බෞද්ධාලෝක මාවත, කොළඹ 07. | දුරකතන - 0112-584623 / 0112-58877 3 | විද්‍යුත් තැපෑල-filmcorp@sltnet.lk | වෙබ් අඩවිය -www.nfc.gov.lk

இல.303, பௌத்தாலோக மாவத்தை, கொழும்பு 07. | தொலைபேசி-0112-584623 / 0112-588773 | மின்னஞ்சல் புத்தககுகுின்-filmcorp@sltnet.lk | இணையத்குளம்-www.nfc.gov.lk

No.303, Bauddhloka Mawatha, Colombo 07. | Tel - 0112-584623 / 0112-588773 | Email-filmcorp@sltnet.lk | Website-www.nfc.gov.lk